# රුහුණ විශ්වවිද්‍යාලය



# ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව
# ශිෂ්‍ය අත්පොත

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

2019/2020

# රුහුණ විශ්වවිද්‍යාලයීය ධජය



# රුහුණ විශ්වවිද්‍යාලයීය ගීතය

බබලන සිරි ලක දකුණේ
විරුවන් බිහි කළ දෙරණේ
පඬුවන් වොරැඳුණු පොරණේ
සරසවියයි මේ රුහුණේ

විද්‍යා ශිල්ප කලා නැණ හරවත්
ලබමින් දන මන කරමින් පැණවත්
දෙස බස රැස සුරකින ඔද තෙදවත්
මිනිසුන් වෙමු ලෝ පසසන ගුණවත්

යුක්තිය ශක්තිය බව නිති සිහි කර
දෑ ගොත් කුල මල පටු මත බිඳ හැර
නම රැක පරසිඳු රෝහණ පුරවර
හිරු සඳු වෙමු ලක් සරසවි නිල’ඹර

ගී පද මාලා : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න
තනු නිර්මාණය සහ සංගීතය : ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව

# රුහුණ විශ්වවිද්‍යාලය

ශිෂ්‍ය අත්පොත
ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව

2019 / 2020

## Vision

“To be the prime intellectual thrust of the nation”

## Mission

“To advance knowledge and skills through teacching, research, and services to serve the society”

**සියලු ම හිමිකම් ඇවිරිණි**

මෙහි සියලු ම හිමිකම් රුහුණ විශ්වවිද්‍යාලයීය
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය සතු වන අතර අනවසරයෙන් උපුටා
ගැනීම සපුරා තහනම් වේ.

# පටුන

උපකුලපතිතුමාගේ පණිවුඩය .................... 8

පීඨාධිපතිතුමාගේ පණිවිඩය .................... 10

අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය .................... 11

අධ්‍යයන මණ්ඩල සභාපතිනියගේ පණිවුඩය .................... 13

පාඨමාලා සම්බන්ධීකාරකගේ පණිවුඩය .................... 14

1. රුහුණ විශ්වවිද්‍යාලය .................... 15

1.1 හැඳින්වීම .................... 15

1.2 විශ්වවිද්‍යාලයේ පිහිටීම .................... 16

1.3 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් .................... 17

1.4 විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය .................... 19

1.5 විශ්වවිද්‍යාලයේ සම්බන්ධතා තොරතුරු .................... 20

2. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය .................... 23

2.1 හැඳින්වීම .................... 23

2.2 ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා .................... 24

2.3 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ නිලධාරීන් .................... 24

2.4 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සම්බන්ධීකාරක .................... 25

2.5 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සම්බන්ධතා තොරතුරු .................... 26

2.6 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ආයතනික ව්‍යුහය .................... 27

3. ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව පවත්වා ගැනීම .................... 28

4. මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ හැඳින්වීම .................... 29

5. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව .................... 34

5.1 හැඳින්වීම .................... 34

5.2 ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය සුදුසුකම් .................... 34

5.3 පාඨමාලා කාලය .................... 35

5.4 ලියාපදිංචි අංකය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත .................... 35

5.5 අධ්‍යයන වර්ෂයක් කල් ලබා ගැනීම .................... 35

5.6 ශාස්ත්‍රවේදී උපාධිලාභියකුගෙන් බලාපොරොත්තු වන ගුණාංග .................... 36

5.7 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ව්‍යූහය ............................................................................ 36
5.8 විෂය නිර්දේශය ........................................................................................................................ 38
5.9 පාඨමාලා ඒකක කේත හැඳින්වීම ........................................................................................ 44
5.10 සමාසික ඉගැනුම් සැලැස්ම හා අඛණ්ඩ ඇගයුම්.......................................................... 45
5.11 පාඨමාලා ඒකක තෝරාගැනිම ............................................................................................ 46
5.12 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම.................................................................................. 48
5.13 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචිය වෙනස් කරවා ගැනීම .............................. 48
5.14 පාඨමාලා ඒකක සඳහා පැමිණීම පවත්වාගෙන යෑම. ...................................................... 48
5.15 පාඨමාලා ඒකක අඛණ්ඩ ඇගයුම් .......................................................................................... 49
5.16 පාඨමාලා ඒකක සමාසික අවසාන පරීක්ෂණ ............................................................. 50
5.17 පරීක්ෂණ සඳහා අයදුම් කිරීම ............................................................................................. 50
5.18 පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ............................................................................ 51
5.19 පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම .......................................................................................... 51
5.20 ඇගයුම් සහ ශ්‍රේණිගත කිරීම ................................................................................................. 53
5.21 සාමර්ථ්‍ය ප්‍රදානය ................................................................................................................ 56
5.22 උපාධිය වලංගු දිනය ............................................................................................................ 56
5.23 ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම ............................................................................................ 57
5.24 උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම .............................................................................. 57
5.25 විභාග නීති ............................................................................................................................ 57
5.26 විභාග අක්‍රමිකතා සහ දඬුවම් .............................................................................................. 58
5.27 සහතිකපත්‍ර නිකුත් කිරීම .................................................................................................... 59
5.28 ගාස්තු .................................................................................................................................... 59
5.29 උපාධි ප්‍රදානෝත්සවය සඳහා සහභාගීවීම ......................................................................... 60
5.30 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ලබාදෙන මාර්ගගත සේවාවන් ...... 60
5.31 දුක්ගැනවිලි කමිටුව (Grievances Committee) ........................................................... 61
5.32 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය . 62
5.33 ලියාපදිංචිය අවලංගු කරවා ගැනීම ........................................................................... 62

# උපකුලපතිතුමාගේ පණිවුඩය



රුහුණ විශ්වවිද්‍යාලයීය උපකුලපති ලෙස අපගේ නවක බාහිර උපාධි අපේක්ෂකයින් සියලු දෙනා වෙත ප්‍රථමයෙන් ම මාගේ සුභාශිංසන පිරිනමමි!

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන රුහුණ විශ්වවිද්‍යාලයෙහි උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාව හිමිවීම ඔබ ලද ඉමහත් භාග්‍යයකි. ඔබ සැම දැනුමෙන්, කුසලතාවන්ගෙන් හා යහපත් ආකල්පවලින් සුපෝෂිත උපාධිධාරියෙකු බවට පත්වනු දැකීම අපගේ ඒකායන අභිලාෂය යි. එබැවින් වඩාත් සඵලදායී ලෙස ඉගෙනීම් හා පර්යේෂණ කටයුතුවල නිරත වීමෙන් ඔබ ලද මෙම අවස්ථාව ඔබගේ ජීවිතයේ ස්වර්ණමය ආයෝජනය බවට පත් කර ගැනීම ඔබ සතු වගකීමකි.

"මුළු මහත් ලෝකය ම වෙනස් කළ හැකි වඩාත් ම බලගතු අවිය අධ්‍යාපනය යි" යනු නෙල්සන් මැන්ඩෙලාගේ ප්‍රකට කියමනක සිංහල අරුත් ගැන්වීම යි. එමගින් ගම්‍ය වන පරිදි ම යම්කිසි රටක ආර්ථික, සාමාජීය මෙන් ම දේශපාලනික ප්‍රගමනය ඇති කිරීමෙහි ප්‍රබල ම සාධකය අධ්‍යාපනය යි. සංවර්ධන ඉලක්ක අබියස තවමත් යම් පසුගාමිත්වයක් පෙන්නුම් කරන අප වැනි රටකට නිසි අධ්‍යාපන ක්‍රමවේද යන්නෙන් විපුල ඵල නෙළාගත හැකි වනු ඇත. රටෙහි පවත්නා උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කර ලීම, මෙහි දී කළ යුතු ප්‍රමුඛතම කාර්යයකි.

2019 වසරේ දී උසස් පෙළ කඩඉම් විභාගය සමත්වූ 181,000ට ආසන්න පිරිසක් උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබීය. නමුත් ඔවුන් අතරින් 150,000 ට ආසන්න පිරිසකට රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට අවස්ථාව නො ලැබුණි. මෙලෙස වාර්ෂික ව උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලත් අතිවිශාල තරුණ පිරිසක් ඊට අවස්ථාව නොලබන අතර එමගින් ඔවුන්ගේ අනාගතය දැඩි අවිනිශ්චිතතාවකට ලක් වේ. මෙම තත්වය දශක ගණනාවක සිට පවතින්නකි.

මෙය මනාව වටහා ගනිමින් එයට යම් විකල්පයක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලයීය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය පිහිටවනු ලැබී ය. ජාතික විශ්වවිද්‍යාල සඳහා ඍජු ප්‍රවේශය නොලද සිසුන් සඳහා උසස් අධ්‍යාපනයට මං පෙත් විවර කරලමින් විවිධ උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා රුහුණ විශ්වවිද්‍යාලයීය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් පිරිනමනු ලබයි. එම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා 8,500 කට ආසන්න බාහිර උපාධිධාරීන් පිරිසක් බිහිකර ඇත. තව ද මේ වන විට 16,500ට අධික බාහිර උපාධි අපේක්ෂකයින් පිරිසක් රුහුණ විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපන කටයුතු වල නියැළෙති.

යල්පැන ගිය විෂය මාලා වෙනුවට නවීන ලෝකයට උචිත වූ රැකියා ඉලක්කගත විෂය මාලා හඳුන්වා දෙමින් අපගේ උපාධි පාඨමාලා යාවත්කාලීන කිරීමට අපි නිරන්තරයෙන් උත්සුක වෙන්නෙමු. න්‍යායාත්මක අධ්‍යාපනයට වඩා ප්‍රායෝගිකත්වයට ප්‍රමුඛතාව දෙන අධ්‍යාපන ක්‍රමවේදයකට ඔබ අනුගත කිරීම අපගේ ප්‍රධාන ඉලක්කයකි. තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ බාහිර උපාධිධාරීන්

අභියෝගයට ලක් නොවිය යුතු බව අපගේ හැඟීම යි. ඔබ දැනුමෙන් හා කුසලතාවෙන් සන්නද්ධ උපාධිධාරියෙකු ලෙස රැකියා වෙළඳපොළ ජය ගත යුතු ය.

ඒ අනුව ඔබ සතු ඉංග්‍රීසි භාෂාමය නිපුණතාව වැඩි දියුණු කර ගැනීමත්, තොරතුරු තාක්ෂණික කුසලතාවන්ගෙන් පරිපූර්ණ වීමත් ඉතා අගනේ ය. එමෙන් ම ඔබතුළ පවත්නා සන්නිවේදන කුසලතා, අන්තර් පුද්ගල සබඳතා ප්‍රමුඛ මෘදු කුසලතා වර්ධනය කර ගැනීම තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ ඔබ වඩාත් ආකර්ෂණීය කරනු ඇත. මෙම සියලු කරුණු සිතෙහි ධාරණය කරගෙන ඔබ සියලුදෙනා වඩාත් උනන්දුවෙන් හා කැපවීමෙන් අධ්‍යාපන කටයුතු වල නිරත වෙමින් නිසිපරිදි උපාධිය සම්පූර්ණ කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු ලෙස ඔබ නුදුරු අනාගතයේ දී අවංක, වගකීම් සහගත, මනුෂ්‍යත්වයෙන් පිරිපුන් පුරවැසියෙකු ලෙස අපගේ මව්බිමට සේවය කරනු ඇතැයි මම විශ්වාස කරමි. ඒ සඳහා ඔබට අවශ්‍ය ශක්තිය, ධෛර්යය නිබඳ ව ලැබේවා යි අපි ප්‍රාර්ථනය කරමු.

සුභ පැතුම්!

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන**
**උපකුලපති**

# පීඨාධිපතිතුමාගේ පණිවිඩය



රුහුණ විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සම්පූර්ණ කර උපාධිධාරී වන ඔබ සියලු දෙනා වෙත උණුසුම් සුභ පැතුම් පිරිනමමි.

විශිෂ්ට මානව ගුණධර්මවලින් හෙබි, ඉහළ වෘත්තීය නිපුණතා සහිත, ගුණාත්මක උපාධිධාරීන් නිර්මාණය සඳහා අවශ්‍යය පසුබිම සකස් කිරීම සහ ඒ සඳහා පහසුකරණ කටයුතු සිදුකිරීම රුහුණ විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ප්‍රමුඛ කාර්ය භාරයකි. එහි දී අප පීඨය විසින් ශස්ත්‍රවේදී උපාධි පාඨමාලා 13ක් පිරිනමනු ලබන අතර, ශාස්ත්‍රවේදී ( බාහිර) උපාධි පාඨමාලාව එම උපාධි පාඨමාලා අතරින් එක් උපාධි පාඨමාලාවකි.

ඉතා වේගයෙන් ඩිජිටල්කරණය වෙමින් තිබෙන වර්තමාන සමාජයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනයට හිමිවනුයේ ප්‍රමුඛතම ස්ථානයකි. විශේෂයෙන් ම covid-19 වසංගත තත්ත්වය තුළ දූරස්ථ අධ්‍යාපනයේ වැදගත්කම අන් කවරදාටත් වඩා වැඩියෙන් ලෝකයට දැනෙමින් තිබේ. එවන් පසුබිමක රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ මෙහෙයවීම මත උපාධියක් දිනාගැනීම දක්වා වූ ඔබගේ උත්සාහය විශේෂ ඇගයීමට ලක්වේ.

උපාධි පාඨමාලාව හැදෑරීමෙන් ඔබ උකහාගත් දැනුම සහ කුසලතා සමාජ සංවර්ධනය සඳහා සක්‍රිය ලෙස උපයෝගීකර ගනු දැකීම අපගේ අපේක්ෂාව යි.

රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයෙකු ලෙසට ලියාපදිංචි ඔබට රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සුභාශිංසන පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**මහාචාර්ය උපාලි පන්නිලගේ**
**පීඨාධිපති**
**මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

# අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය



රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි 19 වන කණ්ඩායම ලෙස 2020/2021 වර්ෂය සඳහා බාහිර උපාධි අපේක්ෂකයන් ලෙස ලියාපදිංචි වී ඇති ඔබ සැම සාදරයෙන් පිළිගන්නා අතර ඔබ සැමට මම සුභාශිංසනය පිරිනමමි.

අප රටේ උසස් අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍යතාවක් හා උනන්දුවක් ඇති සහ ඒ සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති සංඛ්‍යාව ඉතා විශාල වන අතර රජයේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති සීමිත ඉඩකඩ හා පහසුකම් නිසා ඒ සියලු දෙනාට ම අභ්‍යන්තර සිසුන් ලෙසට උපාධි පාඨමාලා හැදෑරීමේ හැකියාව ගිලිහී ගොස් ඇත. එවන් තත්ත්වයක දී රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට තම වයස හෝ උසස් පෙළ සඳහා පෙනී සිටි වර්ෂය වැනි බාධක නොසලකා, රැකියාවක නිරත වෙමින් වුව ද බාහිර උපාධි අපේක්ෂකයන් ලෙසට ලියාපදිංචි වී ඉහළ ප්‍රමිතියකින් යුත් ශාස්ත්‍රවේදී (බාහිර) උපාධියක් ලබා ගැනීමට අවශ්‍ය වාතාවරණය/ පහසුකම් ලබාදීමට කැපවී සිටින්නෙමු. මේ අනුව අප ඒකකය මඟින් රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨයේ මානව සම්පත් දායකත්වය ඇති ව පවත්වාගෙන යනු ලබන ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව 2020 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි නවීකරණය කර ඇත. එම නවීකරණය වූ පාඨමාලාවේ පළමු කණ්ඩායම ලෙසට ඔබ සම්බන්ධ වීම ද ඔබ ලද භාග්‍යයකි.

නවීකරණය වූ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව Sri Lanka Qualifications Framework හි 05 ස්ථලයට (SLQF – Level 5)ට අනුකූල වන අතර, එහි දී සමාසික ක්‍රමය, පාඨමාලා ඒකක, සමාසික අවසාන විභාගය හා අඛණ්ඩ ඇගයීම් යන අංග ඇතුළත් වේ. මෙම පාඨමාලාවේ දී සිසුන්ට විෂයයන් තෝරා ගැනීමට අවස්ථාව ඇති අතර විෂය දැනුමට අමතර ව මෘදු කුසලතා සංවර්ධනය සඳහා දායක වන පාඨමාලා ඒකක හඳුන්වා දී ඇත. එමෙන් ම ඉංග්‍රීසි හා පරිගණක සාක්ෂරතාව වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය පාඨමාලා ඒකක ද ඇතුළත් කර ඇත. මීට අමතර ව සියලු ම සිසුනට දෙවන වසරේ දී හෝ තෙවන වසරේදී පැය 300 ක් වන සීමාවාසික පුහුණුවක් ලබා ගැනිම උපාධිය සම්පූර්ණ කිරීමට අදාළ වන අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙසට පාඨමාලාවට ඇතුළත් කර ඇත. තව ද මෙලෙස නවීකරණය කරන ලද නව පාඨමාලාවේ එකම අභිලාෂය වනුයේ රැකියා වෙළඳ පොළට ගැළපෙන, සමාජයේ ඇති අභියෝගවලට මුහුණ දිය හැකි සහ සමාජයේ ක්‍රියාකාරී පුරවැසියෙක් ලෙසට කටයුතු කළ හැකි උපාධි ලාභියෙකු බිහි කිරීම ය.

ශාස්ත්‍රවේදී බාහිර උපාධිය නවීකරණය කිරීමේ දී, ඉතා උනන්දුවකින් සහ කැපවීමකින් කටයුතු කල මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමා, අධ්‍යයනාංශ ප්‍රධානීන්, පාඨමාලා සංවර්ධන කමිටුවේ ආචාර්ය භවතුන්, අධ්‍යයන මණ්ඩල සභාපති සහ පාඨමාලා සම්බන්ධීකාරක ඇතුලු සියලු දෙනාට රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙනුවෙන් මාගේ හෘදයංගම ස්තුතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙසේ නවීකරණය වූ උපාධි පාඨමාලාවේ දී ඔබට අවශ්‍ය විෂය දැනුම හා අනිකුත් කුසලතා සංවර්ධනය කර ගැනීම සඳහා ඉගැනුම් ක්‍රම කිහිපයක් භාවිත කිරීමට සැලසුම් කර ඇත. ඒ අතරට, මාර්ගගත ක්‍රමය (Zoom හා LMS) හා පන්තිකාමර තුළ ඉගැන්වීම්, කුඩා කණ්ඩායම් ලෙසට විෂයානුබද්ධ ක්‍රියාකාරකම් ලබා දීම, අධ්‍යයන කටයුත නිරන්තරයෙන් අධීක්ෂණය සඳහා අඛණ්ඩ ඇගයීම් පැවැත්වීම ආදිය අන්තර් ගත වේ. බාහිර උපාධි හදාරන සිසුන් ලෙස ඔබටද ඔබගේ උපාධියේ ගුණාත්මක බව වැඩි කරගැනීම සම්බන්ධයෙන් ලොකු වගකීමක් පැවරේ. ඒ සඳහා  මෙම පාඨමාලාව හැදෑරීමේ දී අධ්‍යයන කටයුතු වෙනුවෙන් ඔබගේ අඛණ්ඩ ක්‍රියාකරි සහභාගිත්වය සහ  ඔබගේ කැප වීම අනිවාර්ය වේ.  එමගින් අප බලාපොරොත්තු වන ගුණාත්මකභාවයෙන් වැඩි, අභියෝගවලට මුහුණ දිය හැකි සහ රැකියා වෙළඳපොළ තුළ තරඟයට මුහුණ දිය හැකි උපාධිධාරියකු බිහි කිරීමට හැකියාව ලැබෙනු  ඇත.

බාහිර උපාධි පාඨමාලාවට අමතර ව අප ඒකකය මඟින් විශ්වවිද්‍යාලයේ පීඨ ගණනාවක් සමඟ එක්ව විවිධ සහතික පත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා ගණනාවක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම පාඨමාලා ඉංග්‍රීසි භාෂාව, මානව සම්පත් කළමණාකරණය සහ මනෝවිද්‍යාත්මක උපදේශන ඇතුළු විවිධ වූ කුසලතාවයන් වැඩි දියුණු කර ගැනීමට සහ රැකියා ක්ෂේත්‍ර වල නිපුණතාවයන් වැඩිදියුණු කරගැනීමට ඉවහල් වන අයුරින් සකසා ඇත.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ලියාපදිංචි වී ඇති සෑම ශිෂ්‍යයකුට ම ඔවුන්ගේ අධ්‍යයන කටයුතු පහසු කර ගැනීම වෙනුවෙන් සේවාවන් ගණනාවක් හඳුන්වා දී ඇත. ඒ අනුව ඔබට අවශ්‍යය LMS පහසුකම්, සියලු ම දැනුවත් කිරීම් ආදිය ඒකකයේ වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට ඉඩ සැලසීමත්, SMS සේවාව මඟින් ක්ෂණික තොරතුරු ලබා දීමත් සිදු කරයි. එලෙස ම ඔබගේ දුක් ගැනිවිලි ඉදිරිපත් කිරීමට සහ ඒවාට ක්ෂණික ව පිළිතුරු සැපයීමට දුක් ගැනවිලි කමිටුවක් පත් කර ඇති අතර ඒකකයේ වෙබ් අඩවිය හරහා අයදුම්පත් ලබා ගත හැක. පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම වෙනුවෙන් සහ සිසුන්ට ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් තත්ත්ව ආරක්ෂක ඒකකයක් ප්‍රතිස්ථාපනය කර ඇත.

අප රටේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් වන රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයෙකු ලෙසට ලියාපදිංචි වූ ඔබට අද දින සිට වසර තුනක අවසානයේ දී කුසලතාවලින් පරිපූර්ණ වූ උපාධිලාභියෙකු වීමට හැකිවේවා යි ප්‍රාර්ථනා කරමි!

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වජිරා පී. බුළුගහපිටිය**

**අධ්‍යක්ෂ**

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**

# අධ්‍යයන මණ්ඩල සභාපතිණියගේ පණිවුඩය



රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සහ දූරස්ථ අධ්‍යාපන ඒකකය හා ඒකාබද්ධ ව පිරිනමන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු උපාධි පාඨමාලවකි. වර්තමාන සමාජ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විද්‍යාර්ථීන්ගේ දැනුම, කුසලතාව වර්ධනයට මනා රුකුලක් දෙන පරිදි සංවර්ධනය කරන ලද මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලය මගින් සිදුකරනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් අහිමි වුව ද උපාධියක් හැදෑරීමට සුදුසුකම් ඇති තවත් විශාල සිසු පිරිසකට මෙම බාහිර උපාධි පාඨමාලාව ඔවුන්ගේ අනාගත ඉලක්ක කරායාමට මග පාදනු ඇත. එම සිසුන්ට ද අභ්‍යන්තර සිසුන්ට මෙන් ම විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී අධ්‍යාපනය ලබීමට අද අවස්ථාව සලසා දී තිබීම ඔවුන් ලැබූ තවත් අනර්ඝ අවස්ථාවකි. එහිදී වියත් ඇදුරුමඩුල්ලක් සමග ඇසුරු කිරීමට ලැබීමත් පුස්තකාල පරිහරණයට අවස්ථාව ලැබීමත් මගින් මෙම සිසුන්ට තම දක්ෂතාවන් තවදුරටත් වැඩි දියුණු කරගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

එම අවස්ථාව ඵලදායී ලෙස යොදා ගනිමින් අනාගත සමාජයට අවැසි දක්ෂ මානව ශාස්ත්‍රඥයකු බිහිවනවා දැක්ම අපගේ බලාපොරොත්තුව යි.


**ආචාර්ය දුෂ්මන්ති සිල්වා**
**අධ්‍යයන මණ්ඩල සභාපති - මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය**
**සමාජ විද්‍යා අධ්‍යයනාංශය**
**මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය**

# පාඨමාලා සම්බන්ධීකාරකගේ පණිවුඩය



අනේක විධ දුක් කම්කටොලු මැද ජීවන ගඟුල තරණයට රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවට එක්වූ ඔබ සැමට අපේක්ෂාවන් යථාර්ථයක් කර ගැනීමට අවස්ථාව උදාවේවා! යි සුබ පැතුම් එක් කරමි.

තව ද, කාලීන සමාජයේ වෙනස්කම්වලට අනුරූපී උපාධි පාඨමාලාවක් ලෙස නව පාඨමාලා ව්‍යූහයන් යටතේ මෙම උපාධිය සකසා තිබීම සාම්ප්‍රදායික ක්‍රම රටා අතික්‍රමණය කරලීමක් වේ. ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයක් තුළින් නව සමාජයේ අවශ්‍යතා මත පිරිපුන් විද්‍යාර්ථීන් නිර්මාණය කරලීම අපගේ ව්‍යායාමය යි.

නමුත් ඒ සඳහා විද්‍යාර්ථීන් වන ඔබ සතුව ද, විශාල කාර්යභාරයක් ඇත. අධ්‍යයනය/පර්යේෂණ මෙන් ම, දැනුම සමාජය වෙත විසරණය කරලමින් මහපොළවේ සමාජ යථාර්ථයන් හා ගනුදෙනු කරලීමට ඔබට මෙම පාඨමාලාව මහඟු අත්වැලක් වනු නොඅනුමාන ය.

දැනුම, කුසලතා හා සුපහන් ආකල්පවලින් සුසැදි විද්‍යාර්ථීන් පිරිසක් බිහිකරලීමේ රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ මුඛ්‍ය අපේක්ෂාව මල්ඵල දැරීමට විද්‍යාර්ථයින් වන ඔබ සැමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරමි. ඔබ සියලු දෙනාටම තම දිවි ගඟුලේ අපේක්ෂා යථාර්ථයක් බවට පත් කරලීමට මෙම පාඨමාලාව උපස්ථම්භකයක් වේවා! යැයි සුබ පැතුම් එක් කරමි.

**ආචාර්ය ශම්මික ලියනගේ**
**සම්බන්ධීකාරක - 19 වන ශිෂ්‍ය කණ්ඩායම**
**රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය**
**මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය**

# 1
# රුහුණ විශ්වවිද්‍යාලය

## 1.1 හැඳින්වීම

විශේෂ ජනාධිපති නියෝගයක් මත 1978 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වන දින රුහුණ විශ්වවිද්‍යාලය ආරම්භ කරන්නේ රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය නමිනි. වර්තමානය වන විට කෘෂිකර්ම, ඉංජිනේරු, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා, කළමනාකරණ හා මූල්‍ය, වෛද්‍ය, විද්‍යා, තාක්ෂණ, සම සෞඛ්‍ය විද්‍යා, පශ්චාත් උපාධි අධ්‍යයන යනුවෙන් පීඨ 10කින් සමන්විත වෙයි.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, විද්‍යා, කළමනාකරණ හා මූල්‍ය, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ හා පශ්චාත් උපාධි අධ්‍යයන යන පීඨ රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ (මාතර) පිහිටා ඇත. කෘෂිකර්ම, ඉංජිනේරු, වෛද්‍ය, සම සෞඛ්‍ය හා තාක්ෂණ යන පීඨ පිළිවෙලින් මාපලාන (කඹුරුපිටිය), හපුගල (ගාල්ල), කරාපිටිය (ගාල්ල), කරගොඩ - උයන්ගොඩ (කඹුරුපිටිය) යන ස්ථානවල පිහිටා ඇත. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ඒකකය වැල්ලමඩම පරිශ්‍රයේ පිහිටා ඇත.

විශ්වවිද්‍යාලය විසින් ඒ ඒ පීඨවලට අදාළ විෂයයන් සඳහා ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි (ආචාර්ය උපාධි ඇතුළු ව) පිරිනමන අතර ඊට අමතර ව ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාවන් ද පවත්වනු ලැබේ.



1978 වර්ෂයේ දී ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා සිසුන් 272ක් පමණ බඳවා ගත් අතර පසුගිය දශක හතර තුළ එහි වේගවත් වර්ධනයක් වාර්තා කරමින් 2021 වර්ෂයේ දී පීඨ 9ක් යටතේ සිසුන් සංඛ්‍යාව 8563ක් දක්වා වැඩි කොට ඇත (වගුව 1.1)

**වගුව 1.1 ශිෂ්‍ය සංඛ්‍යාවේ ව්‍යාප්තිය (2021)**

| **පීඨයේ නම** | **ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|
| කෘෂිකර්ම | 0845 |
| ඉංජිනේරු | 0971 |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ | 0299 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 1842 |
| කළමනාකරණ හා මූල්‍ය | 1379 |
| වෛද්‍ය | 1063 |
| විද්‍යා | 1180 |
| සම සෞඛ්‍ය විද්‍යා | 0451 |
| තාක්ෂණ | 0533 |
| විශ්වවිද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 8563 |

## 1.2 විශ්වවිද්‍යාලයේ පිහිටීම



රුහුණ විශ්වවිද්‍යාලෙයේ ප්‍රධාන පරිශ්‍රය පිහිටා තිබෙන්නේ මාතර සිට කි. මී. 4ක් දුරින් කොළඹ - හම්බන්තොට (A2) ප්‍රධාන මාර්ගයෙහි ය. මාතර (සිංහල : මාතර, දෙමළ: மாத்துறை) (මුල් නම මහතොට) යනු කොළඹ සිට කි. මී. 160ක් දුරින් දකුණු වෙරළ තීරයේ පිහිටි නගරයකි. මාතර, ඓතිහාසික ව අයත් වන්නේ ශ්‍රී ලංකාවේ රාජධානි තුනෙන් එකක් වන රුහුණ නම් ප්‍රදේශයට ය. මහාවංශයට අනුව දිවයිනට ප්‍රථමයෙන් පැමිණි ඉන්දියානුවන් පදිංචි වූයේ නිල්වලා ගං තීරයේ ය.

කොළඹ සිට මාතර දක්වා දුම්රියෙන් හෝ බස්රථයෙන් ගමන් කළ හැකි ය. දුම්රිය සංඛ්‍යාව සීමිත වුවත් සාමාන්‍ය මාර්ගය හෝ අධිවේගී මාර්ගය ඔස්සේ සෑම පැය භාගයකට ම වරක් බස් රථ ලබා ගත හැකි ය. කොළඹ සිට සාමාන්‍ය මාර්ගය හරහා ගමන් කිරීම සඳහා පැය 4ක් ද අධිවේගී මාර්ගය හරහා ගමන් කිරීමට පැයකුත් විනාඩි තිහක් ද ගතවේ.

## 1.3 විශ්වවිද්‍යාලයේ නිලධාරීන්


| | |
|---|---|
| **කුලපති** | ආචාර්ය අකුරටියේ නන්ද හිමි |
| **උපකුලපති** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන<br>MD (Colombo), DCH (Colombo), DCH (Sydney) |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය ඊ. පී. එස්. චන්දන<br>B.Sc (special in Zoology) (Ruhuna, SL), M.Phil (Ruhuna, SL) PhD (Kyoto University, Japan) |
| **ලේඛකාධිකාරී** | පී. එස්. කලුගම මිය<br>BA (J'pura), MA (London), MBA (Ruhuna, SL) |

පීඨයන්හි පීඨාධිපතිවරු

| | |
|---|---|
| කෘෂිකර්ම පීඨය | මහාචාර්ය එස් ඩී. වන්නිආරච්චි මහතා<br>BSc Agric (Ruhuna), MSc, PhD (Guelph, Canada) |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | ආචාර්ය ඉමේන්ද්‍ර කොටපොල මහතා<br>BDS (Pera), PhD (Japan) |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය චිත්‍රාල් අඹවත්ත මහතා<br>PhD (Russia), MSc (Russia), MSAE (Japan), FISITA (UK), FIAESL, MSLEMA, MASASL, MSLAAS. |

| | |
|---|---|
| **ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය** | මහාචාර්ය කේ. එච්. එම්. ඒ. දීපානන්ද මහතා<br>B.Sc. (Hons) in Zoology (Ruhuna, SL) M.Sc. (Bremen, Germany) PhD (Kelaniya, SL) |
| **පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය** | මහාචාර්ය එල්. පී. ජයතිස්ස මහතා<br>B.Sc (Ruhuna, SL), Mphil (Ruhuna, SL),<br>PhD (Stirling University, UK) |
| **මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය** | මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා<br>BA , M.Phil, PhD (Ruhuna), PG Dip. (Colombo) |
| **කළමනාකරණ සහ මූල්‍ය පීඨය** | මහාචාර්ය පී. ඒ. පී. සමන්ත කුමාර මහතා<br>PhD (WUT, China), MBA (Col, SL), BBA (Ruhuna, SL) |
| **වෛද්‍ය පීඨය** | මහාචාර්ය අයි. වී. දේවසිරි මහතා<br>MBBS (Pera),DO (Colombo), PhD(Ruhuna) |
| **විද්‍යා පීඨය** | මහාචාර්ය පී. ඒ. ජයන්ත මහතා<br>B.Sc. (Kelaniya, Sri Lanka), M.Sc. (J'Pura, SL), Ph.D. (QUT, Australia). |
| **තාක්ෂණ පීඨය** | ආචාර්ය කේ. ජී. හර්ෂදේව ගුණවර්ධන මහතා<br>PhD (University of Oklahoma, USA), B.Sc (Pera, SL) |
| **පුස්තකාලයාධිපති** | යූ. ඒ. ලාල් මහතා<br>BA. (Honours) (P'deniya, SL), MSSc.(Lib & Inf. Science, Kelaniya, SL), ASLLA |

## 1.4 විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



## 1.5 විශ්වවිද්‍යාලයේ සම්බන්ධතා තොරතුරු

### 1.5.1 තැපැල් ලිපිනය

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ඒකකය වැල්ලමඩමෙහි පිහිටා ඇත. එසේ ම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, විද්‍යා, කළමනාකරණ හා මූල්‍ය, ධීවර සහ සාගර විද්‍යා හා පශ්චාත් උපාධි අධ්‍යයන යන පීඨ රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ (මාතර) පිහිටා ඇත.

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම, මාතර.
81000
ශ්‍රී ලංකාව.

### 1.5.2 විශ්වවිද්‍යාලයේ දූරකථන හා ෆැක්ස් අංක

| | දූරකථනය | ෆැක්ස් |
|---|---|---|
| **වැල්ලමඩම සංකීර්ණය** | +94(0)412222681-2<br>+94(0)412227001-4 | +94(0)412222683 |
| කෘෂිකර්ම පීඨය | +94(0)412292200 | +94(0)412292384 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | +94(0)912247490 | +94(0)912243900 |
| ඉංජිනේරු පීඨය | +94(0)912245765 | +94(0)412245762 |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | +94(0)412227026 | +94(0)412227026 |
| **පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය** | +94(0)412227008 | +94(0)412227008 |
| මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය | +94(0)412227010 | +94(0)412227010 |
| කළමනාකරණ සහ මූල්‍ය පීඨය | +94(0)412227015 | +94(0)412227015 |
| වෛද්‍ය පීඨය | +94(0)412234730 | +94(0)412222314 |
| විද්‍යා පීඨය | +94(0)412222701 | +94(0)412222701 |
| තාක්ෂණ පීඨය | +94(0)412294751 | +94(0)412294989 |

### 1.5.3 විද්‍යුත් තැපෑල/වෙබ්

ලොව ඕනෑ ම තැනක සිට විද්‍යුත් තැපෑලෙන් විශ්වවිද්‍යාලයට පිවිසිය හැකි ය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් කාර්යාලවල විද්‍යුත් ලිපිනයන් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙහි ඇත.

**http://www.ruh.ac.lk**

### 1.5.4 අභ්‍යන්තර දුරකථන අංක

| | |
|---|---|
| උපකුලපති<br>කාර්යාලය | 12001<br>12004/5 |
| නියෝජ්‍ය උපකුලපති<br>කාර්යාලය | 12002<br>12006/7 |
| ලේඛකාධිකාරී<br>කාර්යාලය | 12003<br>12008/9 |
| පීඨාධිපති, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය<br>සහකාර ලේඛකාධිකාරී | 16000<br>16001 |
| පීඨාධිපති, විද්‍යා පීඨය<br>සහකාර ලේඛකාධිකාරී | 14000<br>14001 |
| පීඨාධිපති, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය<br>සහකාර ලේඛකාධිකාරී | 13000<br>13001 |
| පීඨාධිපති, කළමනාකරණ සහ මූල්‍ය පීඨය<br>සහකාර ලේඛකාධිකාරී | 15000<br>15001 |
| පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය<br>සහකාර ලේඛකාධිකාරී | 12400<br>12401 |
| පුස්තකාලයාධිපති | 12300 |
| මූල්‍යාධිකාරී | 12050 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (ගිණුම්) | 12057 |
| සහකාර මූල්‍යාධිකාරී (වැටුප් හා ණය) | 12053 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (ගෙවීම්) | 12061 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්) | 12065 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී (සාමාන්‍ය පරිපාලනය) | 12014 |

| | |
|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරී (විභාග) | 12026 |
| සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය කටයුතු) | 12040 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන ආයතන) | 12035 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (අනධ්‍යයන) | 12031 |
| වැඩ ඉංජිනේරු | 12080 |
| අධ්‍යක්ෂ/ශාරීරික අධ්‍යාපන ඒකකය | 12125 |
| අධ්‍යක්ෂ/අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය | 12118 |
| වෛද්‍ය නිලධාරී | 12200 |
| අධ්‍යක්ෂ/වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය | 12145 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී<br>ප්‍රධාන ආරක්ෂක නිලධාරී කාර්යාලය | 12145<br>12146 |

# 2
# දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

## 2.1 හැඳින්වීම

1997 දී රුහුණ විශ්වවිද්‍යාලය යටතේ පිහිටුවන් ලද බාහිර විභාග ඒකකය (EEU) පසු කලෙක දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය (DCEU) ලෙස නම් කරන ලද අතර, ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමට නොහැකි රටේ අනාගත සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම මෙහි පුළුල් අරමුණ යි. ඇතිව පිහිටුවන ලදී. ආරම්භයේ සිට ම, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින අතර දැනට රට පුරා 30,000කට අධික බාහිර උපාධිධාරීන්ගේ අවශ්‍යතා සපුරාලයි. මීට අමතර ව විවිධ කුසලතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ දැක්ම**

ශ්‍රී ලංකාවේ දූරස්ථ අධ්‍යාපනය සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානයක් වීම යි.

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ මෙහෙවර**

ගෝලීය අවශ්‍යතාවලට සරිලන පරිදි අධ්‍යාපනික ජයග්‍රහණ හඹා යාමේ දී දූරස්ථ අධ්‍යාපනය තුළින් සියලු ම වයස්වල සිසුන්ට අවස්ථා ලබා දීමයි.

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අරමුණු**

ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා මගින් සමාජයට සේවය කිරීම පිණිස දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

**ඒකකයේ ප්‍රධාන කාර්යයන්**

රුහුණ විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ විසින් හඳුන්වා දෙනු ලබන බාහිර, උපාධි සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. ඒ සඳහා අධ්‍යයන මණ්ඩල රැස්වීම් හා කළමනාකරණ කමිටුව පැවැත්වීම හා සම්බන්ධීකරණය.

ඒ අනුව පහත සඳහන් විවිධ කාර්යයන් මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

- පහත දැක්වූ පාඨමාලා සහ විභාග සඳහා සිසුන් ලියාපදිංචි කිරීම.
- ඔවුන්ට පහසුකම්/මාර්ගෝපදේශ සැපයීම
- දූරස්ථ ඉගෙනුම් ආකාරයෙන් හෝ/සහ විශ්වවිද්‍යාලය තුළ, අධ්‍යයන දින දර්ශනයට අනුව

පාඨමාලා සඳහා දේශන/සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැලසීම

- විභාග සඳහා සිසුන් ලියාපදිංචි කිරීම, හා විභාග සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.
- අධ්‍යයන දින දර්ශනයට අනුව විභාග පැවැත්වීමට කටයුතු කිරීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම.
- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු විභාග පිළිතුරු පත්‍ර නැවත පරීක්ෂා කිරීම් කටයුතු සිදු කිරීම.
- දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ, තත්ත්ව ආරක්ෂණ ඒකකය යටතේ පාඨමාලාවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමට හා වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.
- දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ, පාඨමාලා සඳහා අදාළ මූල්‍ය කටයුතු හැසිරවීම
- දුක්ගැනවිලි කමිටුව, අධ්‍යයන මණ්ඩල සහ කළමනාකරණ කමිටුව යනාදිය හරහා සිසුන්ගේ සිසු දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීම හා විසඳුම් ලබා දීම.
- මාර්ගගත පහසුකම් (LMS/ZOOM) හරහා සිසුන්ට ඉගැන්වීමේ පහසුකම් සැලසීම

## 2.2 ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා

- ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව
- ඉංග්‍රීසි සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා
- මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා
- විද්‍යානුකූල තේ නිෂ්පාදනය හා තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලාව
- ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති කළමනාකරණ පිළිබඳ සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

## 2.3 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ නිලධාරීන්

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ප්‍රධානියා ලෙස අධ්‍යක්ෂක (අර්ධකාලීන) කටයුතු කරන අතර එහි පූර්ණ කාලීන ලේඛකාධිවරියක් කටයුතු කරයි.

| | |
|---|---|
| **අධ්‍යක්ෂ** | මහාචාර්ය වජිරා පී. බුළුගහපිටිය මිය<br>B.Sc (Ruhuna, SL), PhD ( Fribourg, Switzerland)<br>රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| **සහකාර ලේඛකාධිකාරී** | එච්. එච්. කෞමදී ධර්මසිරි මිය<br>MSc (Peradeniya, SL), BSc (Peradeniya, SL) |

| | |
|---|---|
| **සහකාර මූල්‍යාධිකාරී** | ශානිකා මධුභාෂිණී පෙරේරා මිය<br>B.B.Mgt.(Accountency) Special - UOK |
| **ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක** | එස්. හරීන්ද්‍ර උයනහේවාගේ මයා<br>Msc in IT (Cardiff, UK), BSc(Ruhuna,SL), MCS(SL) |
| **ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ නිලධාරී** | අසංක සී. හත්තසිංහ මයා<br>BSc (Ruhuna), B.Tech in Film and Television Production Technology (UNIVOTEC), Higher Diploma in Audio Visual Production and Media Technology (UoC) |
| **කළමනාකරණ සහායක** | ටී. පී. ලක්මාල් දිනේෂ් මයා<br>ඒ. ආර්. ඩී. නිසංසලා අහංගම මිය<br>සී. එම්. පතිරණ මිය<br>ඩබ්. ඒ. නදීශානි මිය<br>ජී. ඒ. ටී. නිර්මාණි සමරසිංහ මිය<br>චතුණි කේ. ආර්. වෙල්ලප්පිලි මෙය |
| **වැඩ සහයක** | හේෂාන් කුවිඳු අන්දරගේ මයා<br>පී. එම්. වඩුගේ මයා |

## 2.4 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සම්බන්ධීකාරක


ආචාර්ය ඩී. එල්. ඒ. එච්. ශම්මික මයා

රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

රුහුණ විශ්වවිද්‍යාලය

දුරකතනය - +94 717686432


ඊමේල් - shammikauor@yahoo.com


පාඨමාලා ඒකක සම්බන්ධීකාරකවරුන්ගේ තොරතුරු කළමණාකරන පද්ධතිය හරහා අදාළ සමාසික ආරම්භයේ දී දැනුවත් කරනු ලැබේ.

## 2.5 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සම්බන්ධතා තොරතුරු

| | |
|---|---|
| අධ්‍යක්ෂ | +94 412223133<br>+94 412222681-2 Ext 12100<br>Email : director@dceu.ruh.ac.lk |
| සහකාර ලේඛකාධිකාරී | +94 412222681-2 Ext 12101<br>ardceu@dceu.ruh.ac.lk |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය | +94 412222681-2 Ext 12102-5 |
| ඊමේල් | Email : dceu@admin.ruh.ac.lk |
| වෙබ් ලිපිනය | www.dceu.ruh.ac.lk |
| තැපැල් ලිපිනය | සහකාර ලේඛකාධිකාරී,<br>දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය,<br>රුහුණ විශ්වවිද්‍යාලය,<br>වැල්ලමඩම,<br>මාතර.<br>81000 |

## 2.6 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ආයතනික ව්‍යූහය



# 3

# ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව පවත්වා ගැනීම

මෙම පාඨමාලාව රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මඟින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හරහා පවත්වා ගෙන යනු ලබයි.

මෙම උපාධි පාඨමාලාව, පීඨයේ අභ්‍යන්තර උපාධි පාඨමාලාවේ විෂයයන් හා විෂය කරුණු හා සමගාමී වන අතර එය 2019 දී සමාලෝචනය කර නිම කරන ලදී.

මෙම පාඨමාලාවේ සම්බන්ධීකාරක ලෙසට ආචාර්ය ඩී. එල්. ඒ. ඒච්. ශම්මික මහතා කටයුතු කරයි.

මෙම පාඨමාලාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අදාළ අධ්‍යයන මණ්ඩලය හා එක්ව සිදු කරන අතර එම අධ්‍යයන මණ්ඩලය පහත ආචාර්යවරුන්ගෙන් සමන්විත වේ.

**අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්**

අචාර්ය කේ. ඩී. දුෂ්මන්ති සිල්වා මහත්මිය - සභාපති
ජ්‍යෙ. මහාචාර්ය වජිරා පී. බුළුගහපිටිය මහත්මිය - ලේකම්
ආචාර්ය ජී. එම්. ටී. සී. විජේසුන්දර මහතා
මහාචාර්ය ජී. පී. ටී. එස්. හේමකුමාර මහතා
මහාචාර්ය එස්. ආර්. හෙට්ටිආරච්චි මහත්මිය
ආචාර්ය එස්. ජී. එස්. සමරවීර මහතා
එම්. එස්. අනුපමා මිය
ආචාර්ය ඩී. එල්. ඒ. එච්. ශම්මික මහතා
එන්. ජී. යූ. එස්. විජේපාල මහතා
කේ. එස්. ජී. එස්. නිශාන්ත මහතා
පී. පී. සමරවික්‍රම මිය
එස්. එච්. පියුමි මිය

මෙම පාඨමාලාව සඳහා පීඨයේ සියලු ම අධ්‍යයනාංශ මඟින් විෂයයන් / විෂය ඒකක ලබා දී ඇත. එම අධ්‍යයනාංශ පිළිබඳ ව කෙටි හැඳින්වීමක් මෙහි දක්වා ඇත.

# 4

# මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ හැඳින්වීම

## භූගෝල විද්‍යා අධ්‍යයන අංශය

භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව 1979 ජනවාරි 01 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය තුළ පිහිටුවන ලදී. එය විශ්වවිද්‍යාලය ආරම්භයේ දී පීඨය තුළ ආරම්භ වූ දෙපාර්තමේන්තු හතරෙන් එකකි. එතැන් සිට, මෙම දෙපාර්තමේන්තුව ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතු මෙන් ම ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් භූගෝලීය දැනුම ව්‍යාප්ත කිරීම සතුටුදායක ලෙස සිදු කරමින් සිටියි. භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන විශේෂවේදී සහ සාමාන්‍යවේදී උපාධිය සඳහා වූ අධ්‍යයන පාඨමාලාවන් "ජාතික හා ජාත්‍යන්තර ව පිළිගත්, භූගෝල විද්‍යාව පිළිබඳ කැපී පෙනෙන උපාධිධාරීන් බිහි කිරීම මෙන් ම නව්‍ය සහ විශ්ලේෂණාත්මක ඉගෙනුම් මගින් මානව හා ස්වාභාවික පරිසරය කළමනාකරණය කිරීම" අරමුණු කොටගෙන සකස් කොට ඇත. සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන් ම විශේෂවේදී උපාධිය හැදෑරීමේ අවස්ථාව විද්‍යාර්ථීන්ට ඇති අතර, එයට අමතරව පශ්චාත් උපාධි හැදෑරීමේ අවකාශය ද දෙපාර්තුමේන්තුව තුළ විවර වී ඇත. මානව ක්‍රියාකාරකම් සහ පරිසරය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ අවබෝධයක් ඇති කිරීම සඳහා නිර්මාණය කරන ලද වැඩසටහන් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන අතර ඒ සඳහා කැපවුණු සුදුසුකම් සහිත අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සහ අවශ්‍ය භෞතික පහසුකම් ද දෙපාර්තමේන්තුව තුළ පවතී.

## ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය

ඉතිහාසය අධ්‍යයන අංශය 1978 වර්ෂයේ රුහුණ විශ්වවිද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේ දී ම ස්ථාපිත කරන ලද අධ්‍යයන අංශයකි. 1999 වර්ෂයේ දී පුරාවිද්‍යා විෂයය ද ඉතිහාස අධ්‍යයන අංශයට සම්බන්ධ කරන ලදී. මෙම විෂය ක්ෂේත්‍ර ඔස්සේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලා හතරක් හැදෑරීමට විද්‍යාර්ථීන්ට අවකාශ සලසා දී ඇත. මෙයට අමතර ව ඉතිහාසය පිළිබඳ සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව පවත්වා ගෙන යනු ලබන අතර 2020 වසරේ සිට පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව ද පැවැත්වේ. ඉතිහාස හා පුරාවිද්‍යා ක්ෂේත්‍ර ඔස්සේ පර්යේෂණ කරමින් විද්‍යාර්ථීන්ට සිය පශ්චාත් උපාධි සම්පූර්ණ කර ගැනීමට ද ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ ඉඩ ප්‍රස්තා සලසා ඇත. රෝහණයේ මෙන් ම ජාතික මට්ටමෙන් පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් සමන්විත ස්ථාන ගවේෂණයට හා සංරක්ෂණයට සුවිශාල දායකත්වයක් ලබා දෙන අධ්‍යයන අංශයක් වන රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය මේ වන විට උපාධි හා පශ්චාත් උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් ජාතියට දායාද කොට ඇත.

## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයට අයත් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය 1992 වර්ෂයෙහි ආරම්භ වී වසර 28 ක් තිස්සේ අධ්‍යයන, අධ්‍යාපන, පර්යේෂණ හා භෞතික වශයෙන් සංවර්ධනය වූ දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව තුළ සාමාන්‍ය ශාස්ත්‍රවේදී හා විශේෂ ශාස්ත්‍රවේදී උපාධි සඳහා පාලි, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය හා බෞද්ධ අධ්‍යයන යන විෂයයන් යටතේ පාඨමාලා ඒකක 110ක ඉගැන්වීමේ කටයුතු සිදුකරන අතර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය සඳහා බෞද්ධ සංස්කෘතිය හා පාලි යන විෂයයන් දෙක දැනට හඳුන්වා දී ඇත. ඉදිරියේ දී බෞද්ධ දර්ශනය විෂය ද හඳුන්වාදීමට කටයුතු කරනු ලැබේ. මෙම විෂයයන් ඉගැන්වීමට හා උපදෙස් ලබාදීමට දේශීය හා විදේශීය පශ්චාත් උපාධි ලැබූ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයකින් ද අප අධ්‍යයනාංශය සමන්විත බව සතුටින් දන්වමු. අප අධ්‍යයනාංශයෙහි මෙහෙවර වන්නේ බුදුසමය තුළ අන්තර්ගත සදාචාර සහ සංස්කෘතික වටිනාකම් තුළින් මනුෂ්‍යයා, සමාජය, පරිසරය සහ විශ්වය පිළිබඳ දාර්ශනික හා බුද්ධිමය අවබෝධයක් විද්‍යාර්ථීන්ට ලබාදීම යි.

## රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලයේ, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ, රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ උපාධි පිරිනමන ප්‍රධාන අධ්‍යයනාංශයකි. 2015 වර්ෂයේ දී ස්වාධීන අධ්‍යයනාංශයක් ලෙස විශ්වවිද්‍යාල පද්ධතියට එකතු වුව ද, 1992 වර්ෂයේ සිට ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය යටතේ වැඩ කිරීමෙන් රුස්කරගත් ප්‍රගුණතාවන් සහ විශිෂ්ට අද්දැකීම් සහිත නව අධ්‍යයන හා පර්යේෂණ ආයතනයක් ලෙස ක්‍රමයෙන් ඉදිරියට යමින් පවතී. එහිදී ප්‍රධාන ශාස්ත්‍රීය ධාරාවේ විෂයයන් වන රාජ්‍ය ප්‍රතිපත්ති විද්‍යාව, දේශපාලන විද්‍යාව සහ අන්තර්ජාතික දේශපාලනය අධ්‍යයනය වෙනුවෙන් අවස්ථාවක් හිමිවේ. එයට අමතර ව ශාස්ත්‍රපති, දර්ශනපති සහ දර්ශනශූරී යන පශ්චාත් උපාධි අධ්‍යයනයන් වෙනුවෙන් ද ඉඩප්‍රස්තාවන් පවතී. මෙම අධ්‍යයනාංශය මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා මෙන් ම දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා විද්‍යාර්ථීන්ට අවශ්‍ය ශක්‍යතාවන් ලබා දෙන අතර විද්‍යාර්ථීන්ගේ නිර්මාණශීලිත්වය, නවෝත්පාදන හා වෘත්තීයභාවය ඉහළ නැංවීමේ අවසාන අරමුණ ඇති ව උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර ඇත. ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් මගින් විදේශීය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට විද්‍යාර්ථීන්ට අවස්ථාව ලබාදෙමින් දැනුම ජාත්‍යන්තරකරණය කිරීම අධ්‍යයනාංශයේ ප්‍රධාන අරමුණකි. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරමින් විද්‍යාර්ථීන්ගේ වෘත්තීය හා සමාජ ජීවිතය තුළ ජාතික හා ගෝලීය අභියෝගයන් විශ්වාසයෙන් යුතු ව සපුරාලීම සඳහා අවස්ථාව ලබාදීම අධ්‍යයනාංශයේ විශේෂතාවකි.

නව පර්යේෂණ ඥානය සම්පාදනය වෙනුවෙන් නිරන්තරයෙන් විවිධ ශාස්ත්‍රීය ගවේෂණ සංවිධානය කරමින් ද, නව තාක්ෂණය මගින් කාලීන දේශපාලන කතිකා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සහභාගිත්වයන් සිදු කරමින් ද මෙම අධ්‍යයනාංශය, විශ්වවිද්‍යාලයේ සහ රාජ්‍ය සංවර්ධනය වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් සපයයි.

## සිංහල අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ සිංහල අධ්‍යයනාංශය 1978 වර්ෂයේ දී අරඹන ලදී. සිංහල භාෂාව හා සාහිත්‍ය මෙන් ම ප්‍රාචීන සහ නූතන සාහිත්‍ය විචාර, ජනශ්‍රැති සහ රංග කලා අන්තර්ගත ව පිරිනමනු ලබන උපාධි පාඨමාලාව මගින් පරිපූර්ණ වියත් බවකින් යුත් පුරවැසියකු බිහි කිරීම අපේක්ෂිත ය. එසේ ම වාග්විද්‍යාව සහ සංස්කෘතික අධ්‍යයන මගින් ඥාන පෝෂණයක් ද මේ පාඨමාලාව මගින් සපයනු ඇත. පශ්චාත් උපාධි හැදෑරීමට ද මේ අධ්‍යයනාංශය මගින් අවස්ථාව ලබා දෙන අතර ඒ උදෙසා විෂය ශික්ෂණය සහිත විචාරශීලී, නිරන්තරයෙන් යාවත්කාලීන වන ආචාර්ය මණ්ඩලයක් ද අප අධ්‍යයනාංශය සතු වේ. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය හඳුන්වා දෙනු ලැබුව ද ආචාර්ය මණ්ඩලය එහි දී නිබඳ ව මාර්ගෝපදේශනය සහ සිසුන් සමග මනා සම්බන්ධතාව පවත්වා ගනිමින් උපාධි අපේක්ෂක / අපේක්ෂිකාවන් වෙත ලබාදෙන සහයෝගය මෙහි ලා අගය කළ යුතු ය.

## සමාජ විද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලයේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයට අයත් සමාජ විද්‍යා අධ්‍යයන අංශය 1933 වර්ෂයේ සිට ''සමාජ විද්‍යාව'' හා සම්බන්ධ පාඨමාලාවන් පවත්වා ගෙන යනු ලබයි. සමාජ විද්‍යාව යනු පුද්ගලයාගේ සමාජ චර්යාව විද්‍යාත්මක ව අධ්‍යයනය කරනු ලබන විෂයයකි. සමාජ ප්‍රශ්නවල ස්වභාවය, සමාජ වෙනස්වීම, සමාජ ගතිකතාවන් හඳුනා ගැනීම සඳහා සමාජ විද්‍යා පරිකල්පනය භාවිත කළ හැකි ය. සමාජ විද්‍යාව මානව චර්යාවන්හි විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. සමාජ විකාශනය, සමාජ සංවර්ධනය, සමාජ ව්‍යූහය සහ සංවිධානය, සමාජ ආයතන, සමාජ අන්තර් සම්බන්ධතා වැනි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විධිමත් අවබෝධයක් ලබා ගැනීම සඳහා සමාජ විද්‍යාව, විද්‍යාත්මක පර්යේෂණ සිදු කරයි. සමාජ විද්‍යාව හදාරතනු ලබන විද්‍යාර්ථීන්ට වර්තමාන සමාජය පිළිබඳ ව ක්‍රමවත් අවබෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක දැනුම ලබා දීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

## ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ අතුරෙන් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ දැක්ම හා මෙහෙවර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි අවසාන අභිමතාර්ථය වන්නේ දැනුම සම්බන්ධ හා කුසලතා හා යහගුණයෙන් සපිරි ගුණාත්මක විද්‍යාර්ථයකු සමාජයට දායද කිරීම යි.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා අතර අභ්‍යන්තර උපාධි පාඨමාලාවට සමගාමී ව පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලාවට ද සුවිශේෂ වැදගත් කමක් හිමි වේ. එහි දී විශේෂයෙන් ම තරඟකාරී පරිසරයක් තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වූ එහෙත් උපාධි

පාඨමාලා හැදෑරීමට සුදුසුකම්ලත් දක්ෂ දරුවන් සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලාව සඳහා ඉතා සුවිශේෂ දායකත්වයක් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් සපයනු ලැබේ.

කාලීන ව, නිසි පරිදි විෂය නිර්දේශ සංශෝධනය කරමින් කාලීන අවශ්‍යතාවලට ද ගැළපෙන පරිදි උපාධි පාඨමාලාවන්හි ගුණාත්මකභාවය උසස් කිරීමට ආර්ථික විද්‍යා අධ්‍යයනාංශ මගින් ලබා දෙන දායකත්වය අතිමහත් ය. මෙහි දී මෑතකාලින ව සංශෝධනය කරන ලද විෂය නිර්දේශ යටතේ බාහිර උපාධි පාඨමාලාවට දායකත්වය සැපයීමට සමත්විම ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය ලද භාග්‍යයක් කොට සලකමි.

ගෝලීය හා දේශීය අවශ්‍යතාවලට ගැළපෙන පරිදි අනාගතයේ දී උසස් හා ගුණාත්මක උපාධි පාඨමාලා සැලසුම් කිරීමටත්, ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් ආර්ථික විද්‍යා අධ්‍යයනාංශ සූදානම් ව සිටින බව මෙම පණිවුඩය මගින් දන්වන්නේ ඉමහත් සතුටිනි.

## තොරතුරු තාක්ෂණ ඒකකය

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ තොරතුරු තාක්ෂණ ඒකකය (ITU) 1999 දී ආරම්භ කරන ලද අතර එහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ උපාධි අපේක්ෂකයින්ට උසස් තත්ත්වයේ තොරතුරු හා තාක්ෂණික අධ්‍යාපනයක් ලබා දීම යි. ITU විසින් සියලු ම උපාධි අපේක්ෂකයින් සඳහා අනිවාර්ය පදනම් පාඨමාලා මොඩියුල තුනක් සපයනු ලබන අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂය විෂයයක් වශයෙන් හැදෑරීමට ද අවස්ථාව ලබා දී ඇත. මෙම විෂයයන් ඉගැන්වීමට දේශීය හා විදේශීය පශ්චාත් උපාධි ලැබූ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් ඒකකය සතුව ඇත. මෙම ඒකකයේ මෙහෙවර වන්නේ දේශීය සහ ගෝලීය වෙළඳපලවල අවශ්‍යතා පිළිබඳව විමසිලිමත්ව, තම ප්‍රජාවට සේවය කිරීම සඳහා උගත් සහ ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පුහුණුවක් ඇති උපාධිධාරීන් බිහිකිරීමයි.

## ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය

රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය ව්‍යාපිඨයේ එක් අධ්‍යයනාංශයක් වන ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය (DELT), විශ්වවිද්‍යාලයේ සියලු ම පිඨවල උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි භාෂා අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන බැවින් අද්වීතිය ස්ථානයක් හිමිවේ. මෙම අධ්‍යයන අංශය සුදුසුකම් සහ පුහුණුව ලත් ස්ථිර ආචාර්යවරුන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අධ්‍යයන අංශය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේදී, සෑම මට්ටමක ම සිසුන් සඳහා ශිෂ්‍ය පාදක හා කාර්ය පාදක ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එසේ ම, අධ්‍යයන කටයුතුවලට අමතර ව, මෙම අධ්‍යයන අංශය උපාධි අපේක්ෂකයාගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් මෙහෙයවයි. තව ද, අප අධ්‍යයන අංශය මඟින් සහතික, ඩිප්ලෝමා සහ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව

# තොරතුරු
# හා
# විෂය නිර්දේශය

# 5
# ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව

## 5.1 හැඳින්වීම

පාඨමාලාවේ නම - ශාස්ත්‍රවේදී උපාධි (බාහිර) පාඨමාලාව

මාධ්‍ය - සිංහල

කාල සීමාව - අවුරුදු 03

අර්ඝ සංඛ්‍යාව - 93

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව - SLQF 05

## 5.2 ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය සුදුසුකම්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයේ දී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.

හෝ

රුහුණ විශ්වවිද්‍යාලය මගින් පිළිගෙන ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා තිබීම :

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

(ආ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

(ඇ) ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයෙන් සමත්වීම

(ඈ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු-ගුරු සහතිකය ලබා තිබීම

(ඉ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම

(ඊ) බෞද්ධ ධර්මාචාර්ය අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

- උපාධි පාඨමාලාවට ප්‍රවේශවීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (Sri Lanka Qualifications Framework) සඳහන් වන අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම. ( SLQF Level 4 හෝ NVQF Level 6 සමත් වීම)

හෝ

- විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම

උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරිමට මූලික සුදුසුකමක් වේ.

## 5.3 පාඨමාලා කාලය

ලියාපදිංචිය සිදුකරන දින සිට අධ්‍යයන වර්ෂ තුනක් (03)ක් අවසාන වන තුරු ශාස්ත්‍රවේදී (බාහිර) අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගු වනු ඇත.

අධ්‍යයන වර්ෂ තුන පිළිවෙළින් 1000 ස්ථලය , 2000 ස්ථලය සහ 3000 ස්ථලය යන ස්ථල වශයෙන් නම් කොට ඇත. සෑම අධ්‍යයන වර්ෂයක් ම සති පහළොවක් (15) බැගින් වූ සමාසික දෙකකින් (2) යුක්ත වන අතර අධ්‍යයන වර්ෂ තුනට අයත් මුළු සමාසික සංඛ්‍යාව 06ක් වේ.

## 5.4 ලියාපදිංචි අංකය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත


බාහිර උපාධි අපේක්ෂකයෙකු වශයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ යම් විද්‍යාර්ථියකු ලියාපදිංචි කරන අවස්ථාවේ දී ලියාපදිංචි අංකයක් ප්‍රදානය කරනු ලැබේ. යම් අපේක්ෂකයෙකු බාහිර විභාග සම්බන්ධ ව විශ්වවිද්‍යාලය අමතන සෑම අවස්ථාවක දී ම ස්වකීය ලියාපදිංචි අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ. එම ලියාපදිංචි අංකය ලබා දෙන තුරු අයදුම්කරුවන්ගේ ලියාපදිංචි අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි සඳහන් අංකය තාවකාලික ලියාපදිංචි අංකයක් ලෙස ගෙන කටයුතු කරනු ලැබේ.

උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි කෙරෙන සෑම අයදුම්කරුවෙකු වෙත ම ඔබගේ ඡායාරූපය හා ලියාපදිංචි අංකය ඇතුලු තොරතුරු සඳහන්වන බාහිර ශිෂ්‍ය වාර්තා පොතක් හා ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත හෝ ශිෂ්‍ය හැඳුනුම්පත, ඔබ විශ්වවිද්‍යාලයට පැමිණෙන සෑම අවස්ථාවක දී ම හා අදාළ විභාගයන්ට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ යුතුය.

## 5.5 අධ්‍යයන වර්ෂයක් කල් ලබා ගැනීම

බාහිර අපේක්ෂකයෙකුට තම ප්‍රථම ලියාපදිංචිය වලංගු කාලසීමාව තුළ උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වුවහොත් අපේක්ෂකයකු තව දුරටත් විභාග සඳහා පෙනී සිටීමට අවශ්‍ය නම් අවසාන ප්‍රතිඵල නිකුත් වී මාස 2ක් ඇතුළත ලියාපදිංචිය අලුත් කර ගැනීමට නියමිත ආකෘති පත්‍රය ( SE - 4 ) මගින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවෙත ඉල්ලීමක් යොමු කළ යුතු ය. මෙසේ ලියාපදිංචිය දීර්ඝ කර ගත හැක්කේ ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට උපරිම අධ්‍යයන වර්ෂ හයක් ගතවන තුරු පමණි.

## 5.6 ශාස්ත්‍රවේදී උපාධිලාභියකුගෙන් බලාපොරොත්තු වන ගුණාංග




## 5.7 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහය

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ තුනකින් සමන්විත වේ. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරන සෑම විද්‍යාර්ථියකු විසින් ම පහත සඳහන් පාඨමාලා වර්ග හැදෑරිය යුතු ය.

(අ) හර පාඨමාලා

(ආ) පදනම් පාඨමාලා

(ඇ) අනිවාර්ය සීමාවාසික පුහුණුව

පාඨමාලා වර්ග සහ ඒකක සමාසික අතර බෙදී යන ආකාරය

| පාඨමාලාව | | ප්‍රථම වර්ෂය ( 1000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව | | දෙවන වර්ෂය ( 2000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව | | තුන්වන වර්ෂය ( 3000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව | | පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාවල එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | සමාසිකය 1 | සමාසිකය 2 | සමාසිකය 1 | සමාසිකය 2 | සමාසිකය 1 | සමාසිකය 2 | |
| විෂය සම්බන්ධිත හර පාඨමාලා | ප්‍රධාන විෂය - 1 | 1(3) | 1(3) | 1(3) | 2(2x3=6c) | 1(3) | 2(2x3=6c) | **8(24)** |
| | ප්‍රධාන විෂය - 2 | 1(3) | 1(3) | 1(3) | 2(2x3=6c) | 1(3) | 2(2x3=6c) | **8(24)** |
| | ප්‍රධාන විෂය - 3 | 1(3) | 1(3) | 1(3) | 2(2x3=6c) | 1(3) | 2(2x3=6c) | **8(24)** |
| පදනම් පාඨමාලා | ඉංග්‍රීසි භාෂාව (ELG) | 1(3c) | -- | 1(3) | නැත | 1(3) | -- | **3(9)** |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ITS) | -- | 1(3c) | 1(3) | නැත | 1(3) | නැත | **3(9)** |
| අනිවාර්ය සීමාවාසික පුහුණුව | | නැත | -- | නැත | නැත | -- | 1(3) | **1(3)** |
| **එකතුව** | | **4(12)** | **4(12)** | **5(15)** | **6(18)** | **5(15)** | **7(21)** | **31(93)** |

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ප්‍රධාන විෂයයන් පහත දැක්වේ.**

1. පුරා විද්‍යාව (ACL)
2. බෞද්ධ අධ්‍යයන (BST)
3. ආර්ථික විද්‍යාව (ECN)
4. සමාජ විද්‍යාව (SOC)
5. භූගෝල විද්‍යාව (GEO)
6. තොරතුරු සංනිවේදන තාක්‍ෂණය (ICT)
7. ඉතිහාසය (HIS)
8 දේශපාලන විද්‍යාව (POS)
9 සිංහල (SLS)
10. සමාජ සංඛ්‍යානය (STS)

## 5.8 විෂය නිර්දේශය

| සමාසිකය | පාඨමාලා අංකය | පාඨමාලාව | අර්ඝ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1000 ස්ථලය - පළමු සමාසිකය | | | |
| 1000-1 | ACL11513 | පුරා විද්‍යාව හැඳින්වීම. | 09 (3x3)<br>මෙම පාඨමාලාවලින් තුනක් තෝරා ගත යුතු ය. |
| 1000-1 | BST11513 | භාරතීය බෞද්ධ ඉතිහාසය | |
| 1000-1 | ECN11513 | මූලික සූක්ෂම ආර්ථික න්‍යාය | |
| 1000-1 | GEO11513 | මූලික භූගෝල විද්‍යාව | |
| 1000-1 | HIS11513 | ශ්‍රී ලංකාවේ පුරාතන යුගයේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි. ව. 1215 දක්වා) | |
| 1000-1 | ICT11513 | Basic Computer Architecture and Computer Networks | |
| 1000-1 | PAL11513 | නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය | |
| 1000-1 | POS11513 | දේශපාලන විද්‍යාවේ මූලධර්ම | |
| 1000-1 | SLS11513 | නූතන සිංහල පද්‍ය සාහිත්‍යය | |
| 1000-1 | SOC11513 | සමාජ විද්‍යාව හැඳින්වීම | |
| 1000-1 | STS11513 | මූලික සංඛ්‍යාන ක්‍රම | |
| 1000-1 | ELG11513 | Elements of English Grammar | 03 |
| මුළු අර්ඝ සංඛ්‍යාව | | | **12** |
| **1000 ස්ථලය - දෙවන සමාසිකය** | | | |
| 1000-2 | ACL12513 | මිනිසාගේ භෞතික හා සංස්කෘතික පරිණාමය පිළිබඳ හැඳින්වීම. | |
| 1000-2 | BST12513 | මුල් බුදුසමයේ මූලික ඉගැන්වීම් | |
| 1000-2 | ECN12513 | මූලික සාර්ව ආර්ථික න්‍යාය | |
| 1000-2 | GEO12513 | මූලික සිතියම් විද්‍යාව | |

| | | | |
|---|---|---|---|
| 1000-2 | HIS12513 | ශ්‍රී ලංකාවේ මධ්‍යතන යුගයේ ඉතිහාසය ( ක්‍රි. ව. 1215 සිට 16 සියවස දක්වා) | 09 (3x3)<br>මෙම පාඨමාලා වලින් තුනක් තෝරා ගත යුතු ය |
| 1000-2 | ICT12513 | Database Management | |
| 1000-2 | PAL12513 | පාලි ව්‍යාකරණ හා අනිර්දිෂ්ට ග්‍රන්ථ | |
| 1000-2 | POS12513 | රාජ්‍යය හා සිවිල් සමාජය | |
| 1000-2 | SLS12513 | භාෂා ප්‍රවේශය | |
| 1000-2 | SOC12513 | සමාජ විද්‍යාත්මක පරිකල්පන | |
| 1000-2 | STS12513 | මූලික ව්‍යවහාරික සංඛ්‍යානය | |
| 1000-2 | ITS12513 | Basic Information and Communication Technology Skills | 03 |
| **මුළු අර්ස සංඛ්‍යාව** | | | 12 |
| **මුළු අර්ස සංඛ්‍යාව - 1000 ස්ථලය : (12+12)** | | | **24** |
| **2000 ස්ථලය - පළමු සමාසිකය** | | | |
| 2000-1 | ACL21513 | ශිෂ්ටාචාරයේ ඉතිහාසය | 09 (3x3)<br>මෙම පාඨමාලා වලින් තුනක් තෝරා ගත යුතු ය.(හර) |
| 2000-1 | BST21513 | බෞද්ධ සමාජ දර්ශනය | |
| 2000-1 | ECN21513 | අන්තර් මධ්‍යයික සූක්ෂම ආර්ථික න්‍යාය | |
| 2000-1 | GEO21513 | භූගෝල විද්‍යාවේ දර්ශනය | |
| 2000-1 | HIS21513 | ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගයේ ඉතිහාසය ( ක්‍රි. ව 16 සියවසේ සිට ක්‍රි. ව. 1815 දක්වා) | |
| 2000-1 | ICT21513 | Programming Concepts and Computer Programming | |
| 2000-1 | PAL21513 | බෞද්ධ විනය සාහිත්‍යය | |

| | | | |
|---|---|---|---|
| 2000-1 | POS21513 | සම්භාව්‍ය දේශපාලන න්‍යාය | |
| 2000-1 | SLS21513 | සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණය සහ අද්‍යතන ප්‍රවනතා | |
| 2000-1 | STS21513 | ව්‍යාප්ති න්‍යාය | |
| 2000-1 | SOC21513 | සමාජ විද්‍යාත්මක න්‍යාය හැඳින්වීම. | |
| 2000-1 | ELG21513 | Reading Skills | 03 |
| 2000-1 | ITS21513 | Essential Skills for Digital Presentations | 03 |
| | | **මුළු අර්ඝ සංඛ්‍යාව** | **15** |
| | | **2000 ස්ථලය - දෙවැනි සමාසිකය** | |
| 2000-2 | ACL22513 | ශ්‍රී ලංකාවේ ප්‍රාග් සහ මූල ඉතිහාසය | 18 (3x6) මෙම පාඨමාලා වලින් හයක් තෝරා ගත යුතු ය. |
| 2000-2 | ACL22523 | ඉන්දියාවේ පුරාණ කලාව සහ වාස්තු විද්‍යාව | |
| 2000-2 | BST22513 | බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය | |
| 2000-2 | BST22523 | බෞද්ධ අධ්‍යාපන දර්ශනය | |
| 2000-2 | ECN22513 | අන්තර්මාධ්‍යයික සාර්ව ආර්ථික න්‍යාය | |
| 2000-2 | ECN22523 | ආර්ථික සංඛ්‍යානය | |
| 2000-2 | GEO22513 | භූ රූප විද්‍යාවේ මූලධර්ම | |
| 2000-2 | GEO22523 | භූගෝලීය තොරතුරු පද්ධති | |
| 2000-2 | HIS22513 | ඉන්දීය ඉතිහාසය 2 ( ක්‍රි. ව. 1236 සිට ක්‍රි. ව 1947 දක්වා) | |
| 2000-2 | HIS22523 | යුරෝපා ඉතිහාසය | |
| 2000-2 | ICT22513 | Web Application Development | |

| | | | |
|---|---|---|---|
| 2000-2 | ICT22523 | Productivity Tools for Workspaces | |
| 2000-2 | PAL22513 | ත්‍රිපිටකය හා අටුවා සාහිත්‍ය ඉතිහාසය | |
| 2000-2 | PAL22523 | අනිර්දිෂ්ට ග්‍රන්ථ හා ගද්‍ය රචනා | |
| 2000-2 | POS22513 | නූතන දේශපාලන න්‍යාය | |
| 2000-2 | POS22523 | රාජ්‍ය පරිපාලනයේ මූලිකාංග | |
| 2000-2 | SLS22513 | සිංහල ව්‍යාකරණ පරිචය | |
| 2000-2 | SLS22523 | සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය-1 | |
| 2000-2 | STS22513 | අනුමිතික සංඛ්‍යානය | |
| 2000-2 | STS22523 | සමාජීය විද්‍යා සඳහා ගුණාත්මක පර්යේක්ෂණ විධික්‍රම | |
| 2000-2 | SOC22513 | සාමාජීය පර්යේෂණ හැඳින්වීම. | |
| 2000-2 | SOC22523 | අපරාධ විද්‍යාව | |
| **මුළු අර්ස සංඛ්‍යාව** | | | **18** |
| **මුළු අර්ස සංඛ්‍යාව 2000 ස්ථලය (15+ 18)** | | | **33** |
| **3000 ස්ථලය - පළමු සමාසිකය** | | | |
| 3000-1 | ACL31513 | ශ්‍රී ලංකාවේ පුරාණ කලාව සහ වාස්තු විද්‍යාව | 09 (3x3) මෙම පාඨමාලා වලින් තුනක් තෝරා ගත යුතු ය. (හර) |
| 3000-1 | BST31513 | බෞද්ධ ආචාර විද්‍යාව | |
| 3000-1 | ECN31513 | සංවර්ධන ආර්ථික විද්‍යාව සහ සැලසුම්කරණය | |
| 3000-1 | GEO31513 | දේශපාලන භූගෝල විද්‍යාව | |
| 3000-1 | HIS31513 | බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ක්‍රි. ව. 1815 සියවසේ සිට 1948 දක්වා) | |

| | | | |
|---|---|---|---|
| 3000-1 | ICT31513 | Project Management using MS Project | |
| 3000-1 | PAL31513 | පාළි ප්‍රකරණ සාහිත්‍යය | |
| 3000-1 | POS31513 | තුලනාත්මක දේශපාලනය | |
| 3000-1 | SLS31513 | සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය- 1 | |
| 3000-1 | STS31513 | ව්‍යවහාරික ප්‍රතිපායන විශ්ලේෂණය | |
| 3000-1 | SOC31513 | සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව | |
| 3000-1 | ELG31513 | Academic Writing Skills | 03 |
| 3000-1 | ITS31513 | Internet services and web designing Techniques | 03 |
| **මුළු අර්ඝ සංඛ්‍යාව** | | | 15 |
| **3000 ස්ථලය - දෙවැනි සමාසිකය** | | | |
| 3000-2 | ACL32513 | Paleography and Epigraphy of Sri Lanka | 18 (3x6)<br>මෙම පාඨමාලා වලින් හයක් තෝරා ගත යුතු ය. |
| 3000-2 | ACL32523 | පුරා විද්‍යා උරුම කළමනාකරණය සහ කෞතුකාගාර | |
| 3000-2 | BST32513 | බෞද්ධ කලා හා පුරාවස්තු - 1 (ශ්‍රී ලංකාව) | |
| 3000-2 | BST32523 | බෞද්ධ සමාජ දර්ශනය | |
| 3000-2 | ECN 32513 | රාජ්‍ය අංශයේ ආර්ථික විද්‍යාව | |
| 3000-2 | ECN32523 | මූල්‍ය ආර්ථික විද්‍යාව | |
| 3000-2 | GEO32513 | ශ්‍රී ලංකාවේ භූගෝල විද්‍යාත්මක පැතිකඩ | |
| 3000-2 | GEO32523 | ජල විද්‍යාව | |
| 3000-2 | HIS32513 | යුරෝපා ඉතිහාසය - 2 (16 සියවසේ සිට ක්‍රි. ව 1945 දක්වා) | |

| | | | |
|---|---|---|---|
| 3000-2 | HIS32523 | ඉන්දීය ඉතිහාසය II (ක්‍රි. ව. 1236 සියවසේ සිට ක්‍රි. ව. 1947 දක්වා) | |
| 3000-2 | ICT32513 | Commerce and E- Government Applications | |
| 3000-2 | ICT32523 | Visual Programming | |
| 3000-2 | PAL32513 | පාලි ත්‍රිපිටකයේ සමාජ දර්ශනය | |
| 3000-2 | PAL32523 | පාලි සාහිත්‍ය ඉතිහාසය - නූතන යුගය | |
| 3000-2 | POS32513 | තුලනාත්මක ආණ්ඩු ක්‍රමය | |
| 3000-2 | POS32523 | ජාතිකත්වය සහ ජාතිය ගොඩනැගීම | |
| 3000-2 | SLS32513 | නවකථා අධ්‍යයනය | |
| 3000-2 | SLS32523 | සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය- 2 | |
| 3000-2 | STS 32513 | නියැදි සමීක්ෂණ හා නියැදුම් ක්‍රම | |
| 3000-2 | STS32523 | ප්‍රවර්ගික දත්ත විශ්ලේෂණයි | |
| 3000-2 | SOC32513 | ග්‍රාමීය සමාජ විද්‍යාව | |
| 3000-2 | SOC32523 | සමකාලීන සමාජ ප්‍රශ්න | |
| | EIP32513 | සීමාවාසික පුහුණුව | 03 |
| **මුළු අර්ස සංඛ්‍යාව** | | | **21** |
| **මුළු අර්ස සංඛ්‍යාව - 3000 ස්ථලය (15 + 18)** | | | **36** |
| **උපාධි පාඨමාලාවට අදාළ මුළු අර්ස ගණන (24+33+33)** | | | **93** |

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ පදනම් පාඨමාලා ඒකක සහිත විෂයයන් පහත දැක්වේ.**

1. ඉංග්‍රීසි
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරන සියලු ම විද්‍යාර්ථීන් විසින් ඉහත සඳහන් විෂයයන්ට අදාළ අනිවාර්ය පදනම් පාඨමාලා ඒකක හැදෑරිය යුතු ය. එම අනිවාර්ය පදනම් පාඨමාලා ඒකක පහත දැක්වේ.

| Subject | Semester | Course Unit |
|---|---|---|
| English | Level 1000 / Semester 1 | ELG11513 Elements of English Grammar |
| IT | Level 1000 / Semester 2 | ITS12513 Basic Information and Communication Technology Skills |
| English | Level 2000 / Semester 3 | ELG21513 Reading Skills |
| IT | Level 2000 / Semester 4 | ITS21513 Essential Skills for Digital Presentations |
| English | Level 3000 / Semester 5 | ELG31513 Academic Writing Skills |
| IT | Level 3000 / Semester 6 | ITS31513 Internet services and web desigining Techniques |

අධ්‍යයන වර්ෂයක් සමාසික (semester) දෙකකට බෙදනු ලබන අතර එක් සමාසිකයක් සති 15 ක කාලයකින් සමන්විත වේ. ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගැනීම සඳහා විෂයානුබද්ධ අර්ඝ සංඛ්‍යාව 72 ක් ද පදනම් පාඨමාලා ඒකක අර්ඝ 18ක්ද සීමාවාසික පුහුණුව මගින් අර්ඝ 03 ද සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව උපාධිය සඳහා සම්පූර්ණ කළ යුතු පාඨමාලා ඒකකවලට අදාළ අර්ඝ සංඛ්‍යාව 93කි.

## 5.9 පාඨමාලා ඒකක කේත හැඳින්වීම

විෂය සම්බන්ධිත සෑම පාඨමාලා ඒකකයක් ම හැඳින්වීමට කේත අක්ෂර 3ක් හා අංක 5ක් සහිත සංකේතයක් භාවිත කෙරේ. කේත අක්ෂර වශයෙන් අදාළ විෂයය හෝ අධ්‍යයනාංශය හෝ ඒකකය හෝ පිළිබිඹු කෙරෙන අක්ෂර තුනක් ද, කේත අංකය වශයෙන් වර්ෂය හෝ ස්ථලය (academic year or level), සමාසිකය (semester), අධ්‍යයන පාඨමාලාවේ යෝග්‍යතා මට්ටම (the qualification type), පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය (course unit serial number) හා පාඨමාලා ඒකකයට හිමි අර්ඝ ප්‍රමාණය (number of credits) නියෝජනය කෙරෙන අංක 5ක් යොදා ගනී. පදනම් පාඨමාලා ඒකක හැඳින්වීමට ඒ ඒ විෂයයන්ට ආවේණික කේත මුල් අක්ෂර 3 මගින් දක්වේ.

| ආරම්භක ඉංග්‍රීසි අකුරු 3 | විෂයය (**Subject**) |
|---|---|
| පළමු ඉලක්කම (සිව් වැනි අකුර) | උපාධි පාඨමාලාවේ අධ්‍යයන වර්ෂය (academic year or level) |
| දෙවන ඉලක්කම (පස්වන අකුර) | උපාධි පාඨමාලාවේ අධ්‍යයන වර්ෂයෙහි සමාසිකය (semester) |
| තෙවන ඉලක්කම (හයවන අකුර) | උපාධි පාඨමාලාවේ යෝග්‍යතා මට්ටම (the qualification types) |
| සිව්වන ඉලක්කම (හත්වන අකුර) | සමාසිකයෙහි ආදාළ විෂයයෙහි පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය (course unit serial number) |
| පස්වන ඉලක්කම (අටවන අකුර) | පාඨමාලා ඒකකයට හිමි අර්ඝ ප්‍රමාණය (Number of credits) |

උදාහරණයක් වශයෙන් ECN12523 නැමැති කේත අංකයෙන් අදහස් කෙරෙනුයේ ආර්ථික විද්‍යා විෂය පිළිබඳ උපාධි පාඨමාලාවේ ප්‍රථම වර්ෂයේ දෙවන සමාසිකය තුළ පවත්වනු ලැබෙන උපාධි මට්ටමේ (5) දෙවන පාඨමාලා ඒකකය වන බව සහ එයට අර්ඝ 3 ක් හිමි වන බව ය. GEO22513 යන්නෙන් අදහස් වනුයේ භූගෝල විද්‍යාව විෂය පිළිබඳ උපාධි පාඨමාලාවේ දෙවන වර්ෂයේ දෙවන සමාසිකයේ සාමාන්‍ය උපාධි මට්ටමේ (5) පවත්වනු ලැබෙන පළමුවන පාඨමාලා ඒකකය වන බව සහ එයට අර්ඝ 3ක් හිමි වන බව ය.

| විෂයය | සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව | ECN |
| සිංහල | SLS |

## 5.10 සමාසික ඉගැනුම් සැලැස්ම හා අඛණ්ඩ ඇගයුම්

සිසුන්ගේ අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන්, ආචාර්යවරුන් විසින් මෙහෙයවන සමාසික ඉගැනුම් එක් එක් සමාසිකය සඳහා වෙන් වෙන් ව පැවැත්වේ. එම අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගෙනුම් කළමනාකරන පද්ධතිය (LMS) හරහා හෝ/සහ සිසුන් ගෙන්වා පැවැත්වේ.

සෑම පාඨමාලා ඒකකයක් ම credit 03ක් වන අතර, එහි Direct Contact Hours පැය 45 කි. (01 credit = පැය 15) . මෙම පැය 45 ම ඉගැන්වීම් කරනු ලැබේ. මේවා මාර්ගගතව හා විශ්වවිද්‍යාලය තුළ දී සිදුකරනු ලැබේ. අදාළ දේශනයන් උඩුගත (Upload ) කිරීම LMS හරහා සිදු කරනු ලැබේ.

**අඛණ්ඩ ඇගයීම්**

සෑම පාඨමාලා ඒකකයකට අදාළ අඛණ්ඩ ඇගයීම් 02ක් ඇත. ඒවාට සහභාගී වීම අනිවාර්ය වේ. ඉන් ලකුණු 40 (20X2) අවසාන විභාගය සඳහා ලැබෙනු ඇත.

සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පහත කරුණු ඇතුලත් පාඨමාලා විස්තරයක් පිළියෙල කොට ඇති අතර එය වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

1. පාඨමාලාවේ දී ආවරණය කෙරෙන මාතෘකා
2. ඒ මාතෘකා සඳහා දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව (Time Table)
3. ඒවාට අදාළ අමතර කියවීම්
4. අඛණ්ඩ ඇගයුම් සඳහා යොදා ගැනෙන ක්‍රම හා සම්පූර්ණ කළ යුතු දින

සෑම සමාසිකයක්/වර්ෂයක් ආරම්භයේ දී ම එම අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන කාලසටහනක් ලබා දෙනු ලැබේ.

## 5.11 පාඨමාලා ඒකක තෝරාගැනිම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 01/2021 චක්‍රලේඛනයට අනුව විෂයයන් ලබා දීමේ දී පහත නිර්ණායකයන් සහ විෂයය කාණ්ඩ තෝරාගත යුතු වේ. එම නිර්ණායකයන් පැවති පාඨමාලා ස්වභාවය අධ්‍යයනය කොට, එහි ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා රැකියා අවස්ථා ඉල්ලීම් වෙනස් වන ලෙස උපාධිධාරී රැකියා වියුක්තිය අවම වන ලෙස ඉදිරිපත් කළ නිර්ණායක වේ.

එම නිර්ණායකයන් අතර පහත කරුණු අන්තර්ගත වේ.

- පළමු කාණ්ඩය වඩාත් ම ඉල්ලුම් සහිත විෂයයන් මත බහුතරයක් සිසුන් බඳවා ගැනීම සිදු වූ විෂය සංයෝජනවලින් යුක්ත වේ. පළමු විෂය කාණ්ඩය හරහා එක් විෂයයක් තෝරා ගැනීමට සිසුන්ට ඇති අතර දෙවන කාණ්ඩය  අඩුම සිසුන් බඳවා ගැනීම මත පදනම් වේ. දෙවන විෂය කාණ්ඩය හරහා එක් විෂයයක් තෝරා ගැනීමට සිසුන්ට තේරීමක් තිබේ. (ශිෂ්‍යයන්ට 2වන විෂය කාණ්ඩය හරහා විෂයයන් එකක් හෝ කිහිපයක් තෝරාගත හැක). තව ද, මෙම කාණ්ඩය  හරහා විෂය තෝරා ගැනීමේ දී සිසුන් සඳහා වඩාත් විශාල තේරීමකින් සමන්විත වේ. රැකියා ඉල්ලීම් අනුව අඩුම විෂය තේරීම ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. භාෂා පමණක් කැමති සිසුන්ට මෙම කාණ්ඩය වඩා හොඳ තේරීමක් කළ හැකි ය.

- එක් විෂයයක් සඳහා බඳවා ගැනීම සඳහා සීමාවක් ඇතුළත් කර ඇත. (පාඨමාලාව සඳහා ඇතුළත් කර ඇති මුළු සිසුන් සංඛ්‍යාවෙන් 25%).

- වසර 3ක් තුළ ඉංග්‍රීසි භාෂා පාඨමාලා 3කින් අර්ඝ 9ක් හා වසර 3ක් තුළ තොරතුරු තාක්ෂණ පාඨමාලා 3කින් අර්ඝ 9ක් ඇතුළත් කර ඇත.

- පළමු වසර සම්පූර්ණ කිරීමෙන් පසු ඕනෑම වේලාවක සම්පූර්ණ කළ යුතු අර්ඝ 3ක අනිවාර්ය පාඨමාලා ඒකකයක් ලෙස පැය 300ක වැඩ පදනම් කරගත් පුහුණුව හඳුන්වා දී ඇත. මෙය non-GPA පාඨමාලාවක් වනු ඇත.

මෙහි වැඩිදුර තොරතුරු 01/2021 චක්‍රලේඛණය හරහා ලබාගත හැක.

ඉහත නිර්ණායකයන්ට අනුගතව ඔබට අදාල විෂයයන් අයදුම්කරුවන් විසින් පහත සඳහන් ප්‍රධාන විෂයයන් අතුරින් තුනක් බාහිර උපාධි පාඨමාලාව සඳහා තෝරා ගත යුතු යි. පහත සඳහන් වගුවෙහි දැක්වෙන පරිදි පළමු කාණ්ඩයෙන් එක් විෂයයක් පමණක් ද, දෙවැනි සහ තෙවැනි කාණ්ඩවලින් එක් විෂයයක් බැගින් හෝ විෂයයන් දෙකක් බැගින් ද නියෝජනය වන පරිදි විෂයයන් තුනක් තෝරා ගත යුතුය. පළමු කාණ්ඩය හැර දෙවැනි හා තෙවැනි කාණ්ඩ දෙකෙන් අඩුම වශයෙන් එක් විෂයයක්වත් නියෝජනය වන පරිදි ද විෂයයන් තුනක් තෝරා ගත හැකි ය. එහෙත් පළමු කාණ්ඩය තෝරා ගන්නේ නම් එයින් එක් විෂයයකට වඩා තෝරා ගත නොහැකිය. සෑම ස්ථලයක දී ම (1000, 2000, 3000 ස්ථල) එනම් අධ්‍යයන වර්ෂ තුනේ දී ම පළමු ස්ථලයෙහි දී තෝරාගත් විෂය තුන ම අඛණ්ඩ ව තෝරා ගැනීම සිදු කළ යුතු ය.

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවැනි කාණ්ඩය |
|---|---|---|
| සිංහල | සමාජ සංඛ්‍යානය | සමාජ සංඛ්‍යානය |
| සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව | පාලි* |
| දේශපාලන විද්‍යාව | භූගෝල විද්‍යාව | බෞද්ධ අධ්‍යයන |
| ඉතිහාසය | පුරා විද්‍යාව | පුරා විද්‍යාව |
| | පාලි* | ආර්ථික විද්‍යාව |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) | |

## 5.12 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා සඳහා අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන විෂයයන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට හදාරා තිබීම පූර්ව අවශ්‍යතාවක් නො වේ. එහෙත් ඇතැම් විෂයයන් තෝරා ගැනීමේ දී ඒ සමඟ ම හැදෑරිය යුතු වෙනත් පාඨමාලා ඒකක පිළිබඳ ව පූර්ව අවශ්‍යතා හෝ අ. පො. ස. උසස් පෙළ සඳහා ඒ විෂය හදාරා තිබීමේ අවශ්‍යතාව හෝ අධ්‍යයනාංශ විසින් නියම කොට තිබිය හැකි ය. එබැවින් පූර්ව අවශ්‍යතා අපේක්ෂිත පාඨමාලා ඒකක තෝරා ග ැනීමේ දී ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස විද්‍යාර්ථීන්ට උපදෙස් දෙනු ලැබේ.

පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීමට ඒ සඳහා විශේෂයෙන් සකසන ලද SE - 1 ආකෘති පත්‍රය හෝ මාර්ග ගත (on line) ක්‍රමයට ලියාපදිංචි වන්නේ නම් අදාළ වෙබ් අඩවියේ ඒ සඳහා ඇති මාර්ග ගත (on line) පෝරමය යොදා ගත යුතු ය. මාර්ගගත ක්‍රමය ඔස්සේ ඔබ ලියාපදිංචි වන්නේ නම් එය තොරතුරු කළමණාකරන පද්ධතිය (MIS) හරහා සිදු කරනු ලැබේ. ඒ හරහා ඔබට ලබා දී ඇති ගිණුම හරහා ලියාපදිංචි වීම සිදු කළ ගත යුතුය.

සෑම විද්‍යාර්ථියෙකුම සමාසිකයක් ආරම්භයේ සිට අධ්‍යයන මණ්ඩලය විසින් නියම කරන ලද සති දෙකක කාල සීමාවක් තුළ, අදාළ ස්ථලයේ එම සමාසිකයට නියමිත සියලු ම පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි විය යුතු ය. පළමු වර්ෂය අවසානයේ දෙවන වර්ෂය පළමු සමාසිකය සඳහා ලියාපදිංචි වීමේ දී පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවීම් සිදු කළ යුතුය. ගාස්තු පිළිබඳ තොරතුරු පසුව දැක්වේ.

## 5.13 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචිය වෙනස් කරවා ගැනීම

කිසියම් සමාසිකයක් සඳහා තමන් ලියාපදිංචි වූ කිසියම් ප්‍රධාන විෂය සම්බන්ධිත වෛකල්පික පාඨමාලා ඒකකයක් වෙනස් කරවා ගැනීමට විද්‍යාර්ථියෙකුට අවශ්‍ය වේ නම්, අදාළ සමාසිකයේ ප්‍රථම සති දෙක ඇතුළත ඒ ඉල්ලීම ඉටු කරවා ගත යුතු ය. මේ කාර්යය සඳහා භාවිතා කළ යුතු SE - 2 ආකෘති පත්‍රයක් මගින් හෝ මාර්ගගත (online) ක්‍රමය භාවිත කරන්නේ නම්, අදාළ වෙබ් අඩවියේ ඒ සඳහා ඇති මාර්ගගත (online) පෝරමය භාවිත කර තම ඉල්ලීම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි වෙත යොමු කළ යුතු ය.

## 5.14 පාඨමාලා ඒකක සඳහා පැමිණීම පවත්වාගෙන යෑම.

පාඨමාලා ඒකක සඳහා මාර්ගගත හෝ විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන දේශන සඳහා සහභාගී වීම දැඩි ලෙස දිරිමත් කරන අතර 80% පැමිණීම අනිවාර්ය වේ.

## 5.15 පාඨමාලා ඒකක අඛණ්ඩ ඇගයුම්

විභාග පූර්ව අවශ්‍යතාවක් ලෙස අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ නොකිරීමේ හේතුවෙන් සමාසික අවසන් පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාවක් නොලැබෙන අතර ඔවුන් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබන සිසුන් ලෙස සඳහන් කරනු ලැබේ. එහෙත් අඛණ්ඩ ඇගයුම් සම්පූර්ණ කිරීමෙන් අනතුරු ව ඊළඟ අධ්‍යයන වර්ෂයක දී අදාළ සමාසිකය තුළ පැවැත්වෙන පරීක්ෂණ සඳහා පුනර් ශිෂ්‍යයෙකු ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ඇත.

විද්‍යාර්ථියෙකු යම් විෂයක අඛණ්ඩ ඇගයීම් සඳහා පෙනී නොසිටියේ නම් එම සමාසිකය තුළ පැවැත්වෙන විභාගයන්හි අඛණ්ඩ ඇගයීම් සඳහා පෙනී සිටි අනෙකුත් විෂයයන් සඳහා පෙනී සිටිය හැක.

සමාසිකයට නියමිත අඛණ්ඩ ඇගයීම් සියල්ල එම සමාසිකයේ 15 වන සතිය අවසන් වීමට පෙර සම්පූර්ණ කළ යුතු ය.

එක් පාඨමාලා ඒකකයක් වෙනුවෙන් අවම වශයෙන් ඇගයුම් දෙකක්වත් පවත්වනු ලබන අතර අඛණ්ඩ ඇගයීම් සඳහා හිමිවන මුළු ලකුණු සංඛ්‍යාව 40කි. එම ලකුණු අවසාන සාමාර්ථ්‍යය සඳහා ගණනය කරනු ලැබේ.

වෙනත් අයෙකු විසින් ලියන ලද පැවරුමක් හෝ ඉන් කොටසක් හෝ තමන්ගේ පැවරුමක් ලෙස ඇගයීම් සඳහා ඉදිරිපත් කිරීම පැහැදිලි ලෙස ම විභාග වංචා ගණයේ ලා සලකන අතර, එලෙස ඉදිරිපත් කරනු ලබන පැවරුම්, ඇගයීම සඳහා සලකා නො බලන අතර එවැනි සිද්ධීන් පිළිබඳ තීරණ ගැනීමේ දී විභාග අක්‍රමිකතා කමිටු නිර්දේශ මත සනාතන සභාව වෙත යොමු කරනු ලැබේ.

විද්‍යාර්ථියෙකු නිශ්චිත පාඨමාලා ඒකකයක් සඳහා පවත්වනු ලබන අඛණ්ඩ ඇගයීම් සඳහා වෛද්‍ය හේතූන් නිසා හෝ අධ්‍යයන මණ්ඩලයට සහ පීඨ මණ්ඩලයට සෑහීමකට පත්විය හැකි වෙනත් හේතුවක් නිසා හෝ පෙනී සිටීමට අපොහොසත් වුවහොත්, වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම හා අඛණ්ඩ ඇගයීම් සඳහා නැවත පෙනී සිටීම ඇතුළු වැඩිදුර තොරතුරු අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන අතර එය වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

නමුත් වෛද්‍ය හේතූන් හෝ වෙනත් පිළිගත හැකි හේතූන් මත අඛණ්ඩ ඇගයුම් සම්පූර්ණ නොකිරීමේ හේතුවෙන් සමාසික අවසන් පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටින ඊළඟ අවස්ථාවේ දී ප්‍රථමවර අපේක්ෂකයකු ලෙස සලකනු ලැබේ. (එම විභාගය නැවත පැවැත්වෙන ඊළඟ ප්‍රථම අවස්ථාවේ දී විභාගයට මුහුණ දිය යුතු ය.)

## 5.16 පාඨමාලා ඒකක සමාසික අවසාන පරීක්ෂණ

එක් එක් සමාසිකයට අදාළ සමාසික අවසාන පරීක්ෂණ සමාසිකය අවසානයේ දී පවත්වනු ලැබේ. එම අවසාන පරීක්ෂණයට පෙනී සිටිම සඳහා අවසර ලැබෙනුයේ සියලු අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කළ සිසුන්ට පමණි.

සමාසික අවසාන පරීක්ෂණයෙන් අසමත් වූ පාඨමාලා ඒකකයක් සඳහා පුනර් පරීක්ෂණ නොපැවැත්වෙන අතර එම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම ඊට අදාළ පරීක්ෂණ පැවැත්වෙන ඊළඟ අවස්ථාවක දී ඒ සඳහා පෙනී සිට සාමර්ථ්‍යය ලබා ගත යුතු ය.

අසමත් වූ පාඨමාලා ඒකකයක පරීක්ෂණය වෙනුවෙන් නැවත පෙනී සිටින විට අඛණ්ඩ ඇගයුම් සඳහා ප්‍රථම වතාවේ දී ලැබූ ලකුණු එලෙස ම සැලකිල්ලට ගනු ලැබේ. එසේ වුවද විද්‍යාර්ථියාගේ අභිමතය පරිදි අඛණ්ඩ ඇගයීම් සඳහා නැවත පෙනී සිටීමට හැකි ය. එවැනි අවස්ථාවක අඛණ්ඩ ඇගයීම් සඳහා අවසන් වරට ලබාගත් ලකුණු සංඛ්‍යාව විෂය සාමාර්ථ්‍යය තීරණය සඳහා සලකා බලනු ලැබේ.

විද්‍යාර්ථයෙකු ඔහුට/ඇයට නියමිත පාඨමාලා ඒකකයේ සමාසික අවසාන පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අපොහොසත් වුවහොත්, ඉදිරි පරීක්ෂණයකට පෙනී සිටීමේ දී පුනර් ශිෂ්‍යයෙකු සේ සලකනු ලැබේ. අදාළ අධ්‍යයන මණ්ඩලයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ මණ්ඩලයේ නිර්දේශය සහ සනාතන සභාවේ අනුමැතිය ලද වෛද්‍ය හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් මත සමාසික අවසාන පරීක්ෂණය සඳහා පෙනී නොසිටි සිසුවකු, ඉදිරියේ දී පැවැත්වෙන ආසන්නතම අවස්ථාවේ දී එම සමාසික අවසාන පරීක්ෂණයට ප්‍රථමවරට පෙනී සිටින අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට අවකාශය ඇත.

## 5.17 පරීක්ෂණ සඳහා අයදුම් කිරීම

සිසුන් හට විභාගය සඳහා ලියාපදිංචි වීමට (විභාගයට මාස දෙකකට පෙර) වෙබ් අඩවියේ වෙබ් දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබේ.

විභාගය සඳහා අයදුම් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති සුදුසුකම් හා නිර්ණායක අදාළ වන අතර පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු සම්පූර්ණ කළ යුතු ය. අපේක්ෂකයින් නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට පෙර රිසිට්පත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය. (විභාග ගාස්තු පාඨමාලා ගාස්තු යටතේ ඇතුළත් කර ඇත.)

සෑම සමාසික අවසාන පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් තම තමන් පෙනී සිටින විභාග සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ මඟින් ලබා ගන්නා ලද

අයදුම්පත්‍රයක් මඟින් හෝ මාර්ගගත ක්‍රමය හරහා ලියාපදිංචි වීම අවශ්‍ය වේ. කිසියම් අපේක්ෂකයෙකු එක් වර්ෂයක දී පරීක්ෂණ දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා පෙනී සිටින විට ඒ ඒ පරීක්ෂණ සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

පිළිගත හැකි වෛද්‍ය සහ අනෙකුත් පිළිගත හැකි හේතූන් මත අනුමැතිය දී ඇති අවස්ථාවක දී හැර සෑම අපේක්ෂකයෙකු ම තමා ලියාපදිංචි වූ සෑම පාඨමාලා ඒකකයකට ම එකවර පරීක්ෂණයට ඉදිරිපත් විය යුතු ය.

**පහත සඳහන් හේතු මත ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- අදාළ පරීක්ෂණයට නියමිත සියලු ම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම. (උදා අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ නොකිරීම)
- නියමිත ව දක්වා ඇති අයදුම්පත් මඟින් අයදුම් නොකිරීම.
- නියමිත දිනට අයදුම්පත් ඉදිරිපත් කර නොතිබීම.

## 5.18 පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම

පරීක්ෂණයක් ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර අයදුම්කරුවන් අතුරින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සෑම අපේක්ෂකයෙකුට ම අදාළ පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එය ඒකකයේ වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

## 5.19 පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම

විද්‍යාර්ථියෙකු ලියාපදිංචි කාලය තුළ පහත සඳහන් හේතු නිසා කිසියම් පරීක්ෂණයකට සහභාගි වීමට අපොහොසත් වන අවස්ථාවල දී ඔහුට/ඇයට ඒ වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළ හැකි ය.

**වෛද්‍ය හෝ සනාථ කළ හැකි වෙනත් හේතු**

- විද්‍යාර්ථියා බරපතළ ලෙස රෝගාතුර වීම
- විද්‍යාර්ථියාගේ දෙමව්පියන්ගේ හෝ සහෝදර සහෝදරියකගේ හෝ කලත්‍රයාගේ හෝ දූදරුවන්ගේ හෝ අභාවය
- විද්‍යාර්ථියා ආගමික පූජකවරයකු නම් එම විද්‍යාර්ථියාගේ ප්‍රධාන ආගමික ගුරුවරයාගේ අභාවය
- විද්‍යාර්ථියකුගේ දරු ප්‍රසූතිය

- විද්‍යාර්ථියා අධ්‍යයන හෝ ක්‍රීඩා හෝ සංස්කෘතික කටයුත්තක් හෝ සඳහා ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් හෝ සහභාගී වීම.
- සනාතන සභාවට පිළිගතහැකි වෙනත් හේතුවක්

ඉහත සඳහන් හේතු සමග පහත සඳහන් නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. ඉහත සිදු කරනු ලබන ඉල්ලීම් අදාළ අධ්‍යයන කටයුතු වෙනුවෙන් වෙන් වූ නිශ්චිත දිනයේ සිට දින 14 ක් ඇතුළත දී දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

- වෛද්‍ය හේතු නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අදාළ පරීක්ෂණ දිනය ආවරණය වන පරිදි රජයේ ආරෝග්‍ය ශාලාවකින් හෝ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.
- පවුලේ සාමාජිකයකුගේ අභාවයක් නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අභාවය තහවුරු කිරීම සඳහා මරණ සහතිකය සමග එම ඥාතිත්වය තහවුරු කෙරෙන ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකයක් අවශ්‍ය වේ.
- ප්‍රධාන ආගමික ගුරුවරයාගේ අපවත් වීම නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අපවත් වීම තහවුරු කිරීම සඳහා මරණ සහතිකය සමග එම ගුරු-සිසු සබඳතාව තහවුරු කෙරෙන ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකයක් අවශ්‍ය වේ.
- ක්‍රීඩා හෝ සංස්කෘතික කටයුත්තක් හෝ නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, එම කටයුත්ත සඳහා සහභාගී වූ බව තහවුරු කිරීමට අදාළ බලධාරීන්ගෙන් ලබා ගත් සහතික ඉදිරිපත් කළ යුතු ය.
- වෙනත් හේතුවක් ඉදිරිපත් කරන්නේ නම් එම කාරණය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

විද්‍යාර්ථියෙකු ඉහත සඳහන් හේතු එකක් හෝ කිහිපයක් පහත දැක්වෙන නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර ඉදිරිපත් කළ විට, එම කරුණු සලකා බලා විද්‍යාර්ථියාගේ ඉල්ලීම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෛද්‍ය සහතික සලකා බැලීමේ අනුකමිටුවේ නිර්දේශ මත පීඨ මණ්ඩලය මගින් සනාතන සභාව වෙත යොමු කරනු ලැබේ.

විද්‍යාර්ථියෙකු පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම මත ඉදිරිපත් කරන වෛද්‍ය සහතික හෝ සනාථ කළ හැකි හේතූන්, වෛද්‍ය සහතික සලකා බැලීමේ අනුකමිටුවහි නිර්දේශ මත අනුමැතියන් ලැබූ විට, විද්‍යාර්ථියෙකු එම විභාගය නැවත පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේදී පෙනී සිටිය යුතු අතර එම අවස්ථාව ප්‍රථමවර අපේක්ෂකයකු සේ සලකනු ලැබේ. තවද, එසේ විභාගයට පෙනී සිටීම සඳහා නැවත විභාග ගාස්තු ගෙවිය යුතුය.

## 5.20 ඇගයුම් සහ ශ්‍රේණිගත කිරීම

අඛණ්ඩ ඇගයුම් ලකුණු හා සමාසික අවසාන ලකුණු විෂයයන්හි අවසාන ශ්‍රේණිය සඳහා ගණනය කරනු ලැබේ. උපාධිය සඳහා නියමිත සියලු පරීක්ෂණ අඛණ්ඩ ඇගයීම් සහ සමාසික අවසාන පරීක්ෂණවලින් යුක්ත වන අතර අඛණ්ඩ ඇගයීම් අදාළ සමාසිකය තුළ දී ද සමාසික අවසාන පරීක්ෂණ සමාසිකය අවසානයේ දී පවත්වනු ලැබේ. කිසියම් විශේෂිත අවස්ථාවකදී අවශ්‍ය වුවහොත් නියමිත සමාසික අවසාන පරීක්ෂණය අධ්‍යයන වර්ෂය අවසානයේ දී පවත්වනු ලැබේ.

### ඇගයුම් ක්‍රමය

පාඨමාලා ඒකකවල ඇගයුම් ක්‍රමය පාඨමාලා ඒකක අනුව වෙනස් විය හැකි ය. එහෙත් පොදුවේ සෑම පාඨමාලා ඒකකයක ම ඇගයුම් ක්‍රමය පහත සඳහන් (අ) (ආ) යන ප්‍රධාන සංරචක කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

**(අ) අඛණ්ඩ ඇගයුම්**

වාචික පරීක්ෂණ, පන්ති කාමර පරීක්ෂණ, වාර්තා (Reports), ඉදිරිපත් කිරීම්, (Presentations) සහ ක්ෂණික පරීක්ෂණ (Quizzes), ක්ෂේත්‍ර කටයුතු (field works) සහ විවෘත ග්‍රන්ථ පරීක්ෂණය (Open Book Tests) යනාදිය පළමු සංරචකයට අයත් වන අතර, සියලු ම පාඨමාලා ඒකක සඳහා ලබාදිය යුතු අඛණ්ඩ ඇගයුම් අදාළ පාඨමාලාවේ සම්බන්ධීකාරක විසින් තීරණය කර සමාසිකය ආරම්භයේ දී දැනුවත් කරනු ලැබේ. ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය යනාදී පදනම් පාඨමාලා සඳහා ද මෙම කොන්දේසි අදාළ වේ (ලකුණු 30).

**(ආ) සමාසික අවසාන පරීක්ෂණය**

සමාසික අවසාන පරීක්ෂණය ප්‍රායෝගික හෝ/සහ ලිඛිත හෝ විය හැකි ය. ඒ ඒ පාඨමාලා ඒකක සඳහා පැවැත්විය යුතු පරීක්ෂණවල ස්වරූපය අදාළ පාඨමාලා ඒකකයන්හි සඳහන් කර ඇත. සමාසික අවසාන පරීක්ෂණය සඳහා පිරිනැමෙන මුළු ලකුණු සංඛ්‍යාව 60කි.

**(ඇ) සීමාවාසික පුහුණුව**

මෙය අනිවාර්ය non-GPA පාඨමාලා ඒකකයකි. මෙය සාර්ථකව සම්පූර්ණ කිරීම උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍යතාවකි. මෙය ඔබගේ GPA අගය ගණනයට ඇතුළත් නොවන අතර Non-GPA පාඨමාලා ඒකකයක් වේ. සීමාවාසික පුහුණුව සඳහා ආචාර්යවරයෙකු අධීක්ෂණය සඳහා අනුයුක්ත කරනු ලැබේ. සීමාවාසික පුහුණුව අවසානයේ දී සියලු ම සිසුන් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර ඊට අමතරව ඉදිරිපත් කිරීමක් ද (Presentation) සිදු කළ යුතු ය.

ඒ සඳහා පහත ආකාරයට ලකුණු ලබාදෙනු ලැබේ.

අවසාන වාර්තාව - ලකුණු 60
Log Book ( Maintaing Attendance) - 10 Marks
ඉදිරිපත් කිරීම (Presentation) - ලකුණු 20
Viva Voce Examination - 20 Marks
මෙය සමත්/අසමත් ලෙස ලබා දෙන අතර සමත් වීම සඳහා ලකුණු 50ක් ලබාගත යුතුය.

### ශ්‍රේණි ගත කිරීම

ඒ ඒ පාඨමාලාව පිළිබඳ ඇගයුම් කරනු ලැබෙන්නේ අධ්‍යයනාංශ ප්‍රධානගේ අධීක්ෂණය යටතේ පාඨමාලා සම්බන්ධීකාරක විසිනි. 0% - 100% දක්වා වූ ලකුණු පරාස භාවිත කරමින් ඇගයුම් කරනු ලබන අතර ලබාගන්නා ලකුණු ප්‍රමාණය මත අදාළ ශ්‍රේණිය (Grade) හා ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (Grade Point Value) නිර්ණය කෙරේ. අදාළ ශ්‍රේණි හා ශ්‍රේණි ලක්‍ෂ්‍ය අගය පහත වගුව හි පෙන්නුම් කරේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය (Grade) | ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (Grade Point Value) |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E<br>E* | 0.00 |

එක් එක් සමාසිකය අවසානයේ දී ඒ ඒ සමාසිකය තුළ විද්‍යාර්ථීන් විසින් හදාරන ලද සියලු ම පාඨමාලා ඒකකවල ශ්‍රේණි ලක්ෂ්‍යය අගයන්හි සාමාන්‍යය (Grade Point Average - GPA) ගණනය කෙරේ. එසේ ම උපාධි පාඨමාලාව මුළුමනින් ම අවසන් කළ විට ද, සමස්ත පාඨමාලාව තුළ විද්‍යාර්ථීන්ගේ සාධන මට්ටම ඇගයීම සඳහා GPA ගණනය කරනු ලැබේ. අවසාන සාධන මට්ටම සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද, ගෞරව සාමර්ථ්‍යයක් ද යන්න නිර්ණය කිරීම සඳහා GPA භාවිත කරනු ලැබේ.

ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය යනු ශ්‍රේණි ලක්ෂ්‍ය අගයයන්, අර්ඝ අගයයන්ගෙන් බර තබන ලද අංක ගණිතමය මධ්‍යන්‍යය (GPA is the credit - weighted arithmetic mean of grade point values) යි.

මෙය පහත සමීකරණයේ දැක්වෙන ආකාරයට ගණනය කෙරේ.

$$\textbf{ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය} = \frac{\sum (\text{පාඨමාලා ඒකකය සඳහා ලබා ගත් ශ්‍රේණි ලක්ෂ්‍ය අගය}_i \times \text{අර්ඝ ප්‍රමාණය}_i)}{\text{මුළු අර්ඝ ප්‍රමාණය}}$$

$$\textbf{G.P.A.} = \frac{\sum (\mathbf{CiGPVi})}{\sum \mathbf{Ci}}$$

GPVi = සලකා බලන පාඨමාලාව සඳහා ලබා ගත් ශ්‍රේණි ලක්ෂ්‍ය අගය

Ci = i වෙනි පාඨමාලාවට අයත් අර්ඝ සංඛ්‍යාව

G.P.A. අගය **දශමස්ථාන තුනක්** දක්වා සකස් කළ යුතු ය.

කිසියම් පාඨමාලා ඒකකයක් සමත්වීම සඳහා අවම වශයෙන් C සාමර්ථ්‍යයක් ලබා ගත යුතු අතර C- හෝ ඊට වඩා අඩු සාමර්ථ්‍යයක් ලබා ගතහොත් නැවත වරක් විභාගයට පෙනී සිට එය සමත් කර ගැනීමෙන් GPA අගය වැඩිකර ගත හැකි ය.

පුනර් පරීක්ෂණයක දී පාඨමාලා ඒකකය සඳහා C සමාර්ථයකට වඩා ඉහළ සාමර්ථ්‍යයක් හිමි කර ගනු ලැබුව ද, ප්‍රදානය කරනු ලබන ඉහළම සාමර්ථ්‍යයක් "C" වන අතර හිමි වන GPA අගය 2.0 ක් වේ.

විද්‍යාර්ථියකු විසින් අසමත් වන ලද කිසියම් පාඨමාලාවක් සඳහා පරීක්ෂණයකට පෙනී සිට C- සාමර්ථ්‍යයක් ලබාගෙන තිබියදී එම පාඨමාලාව සඳහා නැවතත් පුනර් පරීක්ෂණයකට පෙනී සිට ඊට වඩා පහළ සාමර්ථ්‍යයක් (D+, D, හෝ E) ලබා ගත්තේ නම්, අවසන් ප්‍රතිඵලය ගණනය කිරීමේදී මුල් වතාවේදී ලබාගත් සාමර්ථ්‍යය හෝ ඉන් අනතුරු ව ලබාගත් ඉහළ ම සාමර්ථ්‍යය සලකා බලා ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

එමෙන් ම ප්‍රතිඵල සටහන්හි පහත කෙටි යෙදුම් හරහා පහත කරුණු අවධාරණය වේ.

| | |
|---|---|
| ප්‍රතිඵල අත්හිටුවා ඇත (Results withheld) | WH |
| ඉල්ලුම් කර නැත (Not applied) | NA |
| පිළිගත හැකි හේතුවක් නොමැති ව නොපැමිණීම (Absent without accepted reason) | AB |
| මූලික සුදුසුකම් සපුරා නැත (Not Eligible) / අඛණ්ඩ ඇගයීම් පමණක් සම්පූර්ණ කර ඇත. (Only the continuous assessments are completed) | NE |
| පිළිගත හැකි වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇත. (Accepted Medical Certificate) | MC |

## 5.21 සාමර්ථ්‍යය ප්‍රදානය

### සාමාන්‍ය සාමර්ථ්‍යය ප්‍රදානය

- ශාස්ත්‍රවේදී උපාධිය ලබාගැනීම සඳහා විද්‍යාර්ථියකු විසින් අවම වශයෙන් නියමිත අධ්‍යයන කාලය තුළ දී අර්ස 93ක් සම්පූර්ණ කළ යුතු ය.
- මෙහි දී විද්‍යාර්ථියා සියලු ම හර සහ පදනම් පාඨමාලා ඒකක සඳහා අවම වශයෙන් C සාමර්ථ්‍යයන් ලබා සමත් විය යුතු ය.
- සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබාගැනීම සඳහා විද්‍යාර්ථියා අවම වශයෙන් 2.00 ක් වූ GPA අගයක් ලබා ගත යුතු අතර මුළු සාමර්ථ්‍ය සංඛ්‍යාවෙන් C – සාමර්ථ්‍ය දෙකකට වඩා ලබා නොතිබිය යුතු ය.

### පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය

ඉහත සුදුසුකම් අධ්‍යයන වර්ෂ 3ක් තුළ දී සපුරා ලූ විද්‍යාර්ථීන්ට පහත වගුවේ සඳහන් පරිදි පංති සාමර්ථ්‍යයක් ප්‍රදානය කරනු ලැබේ.

| GPA | පංති සාමර්ථ්‍යය ප්‍රදානය |
|---|---|
| GPA >= 3.70 | ප්‍රථම පන්ති සාමර්ථ්‍යය |
| 3.30=<GPA<3.70 | දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යය |
| 3.00=<GPA<3.30 | දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යය |

## 5.22 උපාධිය වලංගු දිනය

(අ) විද්‍යාර්ථියෙකු 5.19හි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළද සමාසිකයේ විභාගය පැවැත් වූ අවසාන දිනයට පසු යෙදෙන පළමු සතියේ වැඩ කරන දිනය උපාධිය වලංගු දිනය ලෙස සලකනු ලැබේ.

(ආ) කිසියම් ශිෂ්‍යයෙකුට / ශිෂ්‍යාවකට විභාග කටයුතු හෝ විනය වැරදි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන අවස්ථාවල දී එය අවසන් වන තෙක් විභාග ප්‍රතිඵල නිකුත් නොකරනු ලැබේ. එවැනි අවස්ථාවල දී සනාතන සභාව මගින් දෙන ලද දිනය උපාධිය ප්‍රදානය කරන දිනය ලෙස සලකනු ලැබේ.

## 5.23 ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම

රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතියට යටත් ව පරීක්ෂණවල ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ පසු එම ප්‍රතිඵල සෑම අපේක්ෂකයෙකුට වෙබ් අඩවිය හරහා ලබා දෙනු ඇත. විභාග අක්‍රමිකතා සඳහා දඬුවම් ලැබ සිටින අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල අදාළ අවශ්‍යතා සපුරාලන තෙක් අත්හිටුවනු ලැබේ.

## 5.24 උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම

ප්‍රතිඵල නිරවද්‍යතා පරීක්ෂා සිදු කරගැනීමට අවශ්‍ය විද්‍යාර්ථීන් සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිගෙන් ලිඛිත ව නියමිත ආකෘති පත්‍රය භාවිතයෙන්, අදාළ පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් වූ දිනයේ සිට දින 14ක් ඇතුළත ඉල්ලුම් කළ යුතුය. ඒ සඳහා අදාළ ගාස්තු ගෙවීම් සිදු කළ යුතු ය. වැඩිදුර තොරතුරු විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සමඟ වෙබ් අඩවිය හරහා ලබාදෙනු ලැබේ.

## 5.25 විභාග නීති

### අනන්‍යතාව තහවුරු කිරීම

විභාග අපේක්ෂකයින් ශිෂ්‍ය වාර්තා පොත සහ නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගයේ දී ඔවුන් ළඟ තබාගත යුතු ය. ප්‍රවේශ පත්‍රයේ ඇති ශිෂ්‍ය අත්සන ප්‍රවේශ පත්‍රයේ සඳහන් පරිදි බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

අයදුම්කරුවන් විභාගයේ දී අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, අසමත් වුවහොත් අපේක්ෂකයාට විභාග යට පෙනී සිටීමට අවසර හිමි නොවනු ඇත.

### විභාග ශාලාවට ඇතුළු වීම

අයදුම්කරුවන් විභාග ශාලාවට කැඳවන තෙක් ඔවුන් විභාග ශාලාවෙන් බැහැරව සිටිය යුතු අතර, ලියපදිංචි අංකයට අනුව අපේක්ෂකයා ඔහුට/ඇයට වෙන් කර ඇති ආසනයේ පමණක් අසුන්ගත යුතු ය.

### විභාග ශාලාව තුළ පිළිපැදිය යුතු උපදෙස්

අපේක්ෂකයින් විභාග ශාලාවේ ශාලාධිපති/ නිරීක්ෂකගේ අධිකාරිය යටතේ සිටින අතර, ශාලාධිපති/ නිරීක්ෂකගේ විභාගයට පෙර, අතරතුර සහ පසු ව අවශ්‍ය උපදෙස් ආදිය ලබා දීමෙන් අපේක්ෂකයින්ට සහාය වනු ඇත. එම උපදෙස් පිළිපැදීම අනිවාර්ය වේ.

හදිසි අවශ්‍යතාවකදී, අපේක්ෂකයාට ශාලාධිපති/ නිරීක්ෂක සමඟ සන්නිවේදනය කළ හැක.

විභාගය ආරම්භ වී පැය භාගයක් ඉකුත් වූ පසු කුමන හේතුවක් නිසා හෝ කිසිදු අපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළත් කරනු නො ලැබේ.

නියම කර ඇති විභාග නීති සහ රීති උල්ලංඝනය කරන අපේක්ෂකයෙකු විභාග වරදක් කර ඇති බව සලකනු ලැබේ.

### විභාග ශාලාවෙන් පිටවීම

විභාග ශාලාවෙන් පිටවිය හැක්කේ විභාගය අවසන් බව ශාලාධිපති විසින් දැනුම් දී පිළිතුරු පත්‍ර බාරගැනීමෙන් පසු අවසර ලබා දීමෙන් පසු ව ය. තව ද, විභාගය ආරම්භ වී පැයක් ගත වන තුරු හෝ ප්‍රශ්න පත්‍රයේ අවසන් මිනිත්තු 15 තුළ කිසිදු අපේක්ෂකයෙකුට ශාලාවෙන් පිටවීමට ඉඩ නොදේ.

## 5.26 විභාග අක්‍රමිකතා සහ දඬුවම්

විභාග නීති උල්ලංඝනය කිරීම පිළිබඳ විශ්ව විද්‍යාල නීති රෙගුලාසි මෙම පාඨමාලාවේ සියලු පැවරුම් සහ විභාග සඳහා අදාළ වේ.

ලියාපදිංචි වූ කිසියම් ශිෂ්‍යයෙකු යම් විනය විරෝධී ක්‍රියාවකට හෝ සාපරාධී ක්‍රියාවකට වැරදිකරු වූ බව සනාථ වුවහොත් ඔහුගේ හෝ ඇයගේ ශිෂ්‍යභාවය පවත්වාගෙන යාම සහ උපාධිය පිරිනැමීම පිළිබඳ ව විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් සහ පාලක සභාව විසින් ගනු ලබන තීරණවලට යටත් වන්නේ ය.

විභාග රීති / රෙගුලාසිවල දක්වා ඇති ඕනෑම අවශ්‍යතාවක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කරන අපේක්ෂකයෙකු විභාග වරදක් කර ඇති අයෙකු ලෙස සලකනු ලැබේ.

අපේක්ෂකයින්ට විභාගයට අදාළ පහත සඳහන් කරුණු තහනම් වේ.

- අනුමත නොකරන ලද ලිපි ලේඛන ආදිය සන්තකයෙහි තබා ගැනීම (දේශන සටහන්, කෙටි සටහන් ආදිය)
- විභාග ප්‍රවේශ පත්‍රයෙහි, ශිෂ්‍ය අත්පොතෙහි, ශරීරයෙහි හෝ ඇඳුම් ආදියේ සටහන් ලියා ගැනීම.
- කොපි කිරීම/ පිටපත් කිරීම.
- කොපි කළ බව පිළිතුරු පත්‍ර ලකුණු කිරීමේ දී අනාවරණය වීම.
- විභාග අපේක්ෂකයෙකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
- ජංගම දූරකථන හෝ එබඳු සන්නිවේදන උපකරණ භාවිත කිරීම හෝ ළඟ තබා ගැනීම.
- යම් විභාග වරදක් කිරීමට ආධාර දීම හෝ අනුබල දීම.
- විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපි ද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.

විභාග වරදකට වරදකරු වූ අපේක්ෂකයෙකු පහත දඬුවම් එකකට හෝ කිහිපයකට යටත් වේ.

- විභාග අක්‍රමිකතා සිදුකරන ලද විෂය ප්‍රතිඵල අවලංගු කිරීම, සම්පූර්ණ විභාගයේ හෝ කොටසක ප්‍රතිඵල අහෝසි කිරීම.
- විභාගයේ සම්පූර්ණයෙන් හෝ කොටසකින් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම.
- සනාතන සභාව තීරණය කරන පරිදි විශ්වවිද්‍යාල විභාග දින නියමයක් නොමැති ව හෝ කාලයක් සඳහා අත්හිටුවීම.
- සනාතන සභාව තීරණය කරන පරිදි විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය සම්පූර්ණයෙන් හෝ යම් කාලයක් සඳහා අත්හිටුවීම.
- සමාර්ථ ලැයිස්තුවෙන් ඔහුගේ/ඇයගේ නම ඉවත් කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වීම තහනම් කිරීම.

## 5.27 සහතිකපත්‍ර නිකුත් කිරීම

### විෂය ශ්‍රේණි සහතික නිකුත් කිරීම

අවසාන උපාධි පරීක්ෂණයෙහි ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමත කරනු ලැබූ පසු අදාළ සහතික පත්‍ර උපාධිධාරීන්ට නිකුත් කරනු ලැබේ. පාඨමාලා ඒකක සඳහා සහතික පත්‍ර නිකුත් කරනු නොලැබේ. පරීක්ෂණයක ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමතකර නිකුත් කරනු ලැබූ පසු, අපේක්ෂකයන්ට දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයෙන් සැපයෙන නියමිත ආකෘති පත්‍ර මගින් අයදුම්කර අදාල සහතික ලබාගත හැකි ය.

### උපාධි සහතික නිකුත් කිරීම

අවසාන උපාධි පරීක්ෂණයක ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමත කරනු ලැබීමෙන් අනතුරුවූ

උපාධිධාරීන්ට උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වූ පසු උපාධි සහතික නිකුත් කරනු ලැබේ. එය උපාධි ප්‍රධානෝත්සව දිනයේ හෝ වෙනත් දිනයක නිකුත් කරනු ලැබේ.

## 5.28 ගාස්තු

ලියාපදිංචි ගාස්තු - එක් වර්ෂයක් සඳහා රු. 4500.00

පාඨමාලා ගාස්තු - එක් වර්ෂයක් සඳහා රු. 18000.00

විභාග ගාස්තු - එක් වර්ෂයක් සඳහා රු. 8000.00

විෂය නාම ශ්‍රේණි සහතිකපත්‍ර ගාස්තු - රු. 2000.00 මෙය උපාධිය සම්පූර්ණ වූ විට ලබා දෙනු ලැබේ.

**ඉහත ගාස්තු වර්ෂ තුන සඳහා රු. 93500.00 වනු ඇත. මෙය වාරික 03 ලෙස ගෙවීම් සිදු කිරීම සඳහා අවස්ථාව ඇති අතර තොරතුරු වෙබ් අඩවියහි පළ කරනු ලැබේ.**

අසමත් වූ ප්‍රශ්න පත්‍ර සඳහා නැවත පෙනී සිටීම ගාස්තු - රු. 1000.00 (එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා)

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය ගාස්තු - රු. 1000.00 ( එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා)

ශිෂ්‍ය වාර්තාපොත සඳහා ගාස්තු - රු. 750.00

සහතිකයක ඡායා පිටපතක් සහතික කර දීමට - රු. 250.00 ( එක් පිටපතක් සඳහා)

## 5.29 උපාධි ප්‍රධානෝත්සවය සඳහා සහභාගීවීම

නියමිත පරිදි උපාධිය සම්පූර්ණකරන ලද සිසුන් සඳහා උපාධි ප්‍රධානෝත්සවය සඳහා සහභාගීවිය හැකි අතර එයට අදාල තොරතුරු වෙබ් අඩවිය හරහා ඔබව දැනුවත් කරනු ලැබේ.

## 5.30 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් ලබාදෙන මාර්ගගත සේවාවන්

ඒකකය මඟින් මාර්ගගත සේවා ලෙස මූලිකව ඉගෙනුම් කලමණාකරන පද්ධතිය හා තොරතුරු කලමණාකරන පද්ධතිය වෙබ් අඩවිය හරහා ලබා දෙනු ලැබේ. ඉගැන්වීම් / අධ්‍යයන කටයුතු මූලික්වම මාර්ගගතව ඉගෙනුම් කළමණාකරන පද්ධතිය හරහා ලබාදෙනු ලැබේ. එමගින් ඔබට ලබාදෙන ගිණ්ඹම හරහා දේශන හා අඳාල පාඨමාලා අත්පත්‍රිකා ලබාගත හැක. ඒවා භාවිතයට අදාල තොරතුරු පාඨමාලාව ආරම්භයේදී මාර්ගගත වැඩමුළු ලෙස දැනුවත් කරනු ලැබේ. තවද, වෙබ් අඩ්විය හරහා එම කලමණාකරන පද්ධතිය භාවිතයට අදාල මාර්ගෝපදේශයන් පල කරනු ඇත.

තවද, තොරතුරු කළමණාකරන පද්ධතිය ඔබගේ මූලික තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකල හැක. එමෙන් ම ඔබට අදාල විශයයන් ලියාපදිංචිවීම්, සමාසික ලියාපදිංචි වීම්, විභාග ප්‍රවේශපත්‍ර ලබාදීම, විභාග ප්‍රථිඵල ලබාදීම, ගෙවීම වවුචර්පත් ලබාදීම හා අනෙකුත් පාඨමාලාවට අදාල තොරතුරු ලබාදීම සිදු කරනු ලැබේ.

එමෙන් ම වෙබ් අඩවිය හරහා පොදු නිවේදන, කාලසටහන්, පාඨමාලා තොරතුරු, අයදුම්පත්, ගෙවීම වවුචර්පත්, කාර්යාලයීය තොරතුරු හා කාර්ය මණ්ඩල තොරතුරු ලබාදීම අදිය සිදු කරනු ලැබේ.

## 5.31 **දුක්ගැනවිලි කමිටුව** (Grievances Committee)

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය යටතේ ලියාපදිංචි වූ සිසුන්ට උපකාර කිරීම සඳහා දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවීමට දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය පියවර ගෙන ඇත.

කමිටුවේ සංයුතිය බාහිර උපාධි වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු - තිදෙනෙකු වේ. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී රැස්වීමේ කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ඇත. මෙම කමිටුව මසකට වරක් රැස්වී සිසුන්ගේ ඉල්ලීම් පිළිබඳ ව සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අදාළ අධ්‍යයන මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

පහත කරුණුවලට අදාළ සිසුන්ගේ ඉල්ලීම් දුක්ගැනවිලි කමිටුවට ඉදිරිපත් කළ හැක.

- විභාග සම්බන්ධ ගැටලු
- පාඨමාලා ඒකක තෝරාගැනීම් සම්බන්ධ ගැටලු
- පාඨමාලා ලියාපදිංචි කිරීමට අදාළ ගැටලු
- විභාග ප්‍රතිඵලවලට අදාළ ගැටලු
- විභාග සඳහා සහන වාරයක් ලබාගැනීම
- ඉගෙනුම් ආධාරක/මාර්ගගත ක්‍රමය සම්බන්ධ ගැටලු
- මුදල් ගෙවීම් සම්බන්ධ ගැටලු
- දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හා සම්බන්ධ සිසුන්ගේ වෙනත් ගැටලු

**දුක්ගැනවිලි කමිටුව සමාජිකයන්**

| | | |
|---|---|---|
| ආචාර්ය ආර්. ඒ. එස්. රණබාහු මිය | - | කමිටු සභාපති |
| ආචාර්ය ඩී. එල්. ඒ. එච්. ශම්මික මයා | - | කමිටු සාමාජික |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්. වී. අයි. අබේවික්‍රම මයා | - | කමිටු සාමාජික |

වැඩිදුර තොරතුරු හා අයදුම්පත් වෙබ් අඩවිය හරහා ලබා ගත හැක.

දුක්ගැනවිලි අයදුම් කිරීම සඳහා වෙබ් අඩවියහි ඇති ආදර්ශ අයදුම්පත්‍රය පමණක් භාවිත කළ යුතු අතර එයට අදාළ ඇමුණුම් ඇත්නම් ඒවා ද සමග සහකාර ලේඛකාධිකාරී දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත යොමු කළ යුතු ය.

## 5.32 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය

බාහිර උපාධි සහ අනෙකුත් පාඨමාලාවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ අරමුණින් තත්ත්ව ආරක්ෂණ ඒකකය පිහිටුවා ඇත.

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය සමාජිකයන්**

| | |
|---|---|
| ජ්‍යෙ.මහාචාර්ය වජිරා පී. බුළුගහපිටිය මිය | - සභාපති (අධ්‍යක්ෂ/දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය) |
| හේමන්තිමාලා වනිගසිංහ මිය | - පාලක සභා නියෝජිත |
| මහාචාර්ය විජිත් ජයමාන්න මයා | - සභාපති / අධ්‍යයන මණ්ඩල, කෘෂිකර්ම පීඨය |
| මහාචාර්ය කේ. එච්. එම්. ඒ. දීපානන්ද මයා | - සභාපති / අධ්‍යයන මණ්ඩල, ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය |
| අචාර්ය කේ. ඩි. ඩී. ජී. සිල්වා මිය | - සභාපති / අධ්‍යයන මණ්ඩල, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය |
| ඩබ්. එම්. ආර්. ලක්සිරි මයා | - සභාපති / අධ්‍යයන මණ්ඩල, කළමණාකරණ හා මූල්‍ය පීඨය |
| සී. සෙනෙවිරත්න මිය | - නියෝජ්‍ය ලේඛකාධිකාරී / විභාග |

## 5.33 ලියාපදිංචිය අවලංගු කරවා ගැනීම

බාහිර උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි ලියාපදිංචිය අවලංගු කරවා ගත හැකි ය. පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකූල ව කටයුතු කිරීමට හෝ නියමිත ව ඇති අපේක්ෂකයකු විසින් කරනු ලබන එවැනි ඉල්ලීමක් සලකා බලනු නො ලැබේ. ලියාපදිංචිය අවලංගු කිරීමේ දී ලියාපදිංචි වීම සඳහා ගෙවන ලද ගාස්තු කිසිවක් ආපසු ගෙවනු නො ලැබේ.

# DCEU

UNIVERSITY OF RUHUNA

2019/2020


CONTACT US

Distance and Continuing Education Unit,
University of Ruhuna, Matara, Sri Lanka

04122 23133
04122 22681 - 2

dceu@admin.ruh.ac.lk